**ශීර්ෂය - 114 - ප්‍රවාහන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු**

**පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තා කොටස් දෙකකින් සමන්විත වේ.

1. කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2. කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**ප්‍රවාහන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල**

**ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

## 2.1 විසර්ජන ගිණුම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 56,659,000,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.47,853,971,203 ක් උපයෝජනය කර තිබුණි.ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.138,090,867 ත් රු.5,713,887,082 ත් අතර පරාසයකින් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 5.14 සිට සියයට 47.17 ක් දක්වා වූ පරාසයක පැවතිණ. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 114 | ප්‍රවාහන අමාත්‍යාංශය | 5,705,810,000 | 6,406,100,000 | 5,667,471,138 | 730,551,780 | 8,338,862 | 5,675,548,220 |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 9,012,790,000 | 32,847,800,000 | 8,647,655,193 | 30,259,883,959 | 365,134,807 | 2,587,916,041 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 1,553,300,000 | 1,133,200,000 | 1,528,893,206 | 1,019,515,927 | 24,406,794 | 113,684,073 |
| | **එකතුව** | **16,271,900,000** | **40,387,100,000** | **15,844,019,537** | **32,009,951,666** | **427,880,463** | **8,377,148,334** |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය යටතේ එන දෙපාර්තමේන්තු 02 ක් විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේත 04 ක් යටතේ එකතුව රුපියල් මිලියන 12,199 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර එම ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 523 කින් ඉක්මවා රුපියල් මිලියන 12,722 ක ආදායමක් රැස්කර තිබුණි.ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම සියයට 4 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත | තථ්‍ය | ඇස්තමේන්තුගත ආදායම ඉක්මවීම | ඉක්ම වූ ඇස්තමේන්තුගත ආදායම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | %. |
| දුම්රිය සාමාන්‍යාධිකාරී | 20:01:01:00 | 4,497,000,000 | 4,851,876,013 | 354,876,013 | 08 |
| මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් | 20:03:02:14<br>10:03:07:04<br>10:03:01:00 | 7,702,400,000 | 7,870,314,096 | 167,914,096 | 02 |
| | | 12,199,400,000 | 12,722,190,109 | 522,790,109 | |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 114 | 11401 | 9,000,000 | 5,654,852 | 3,800,000 | 4,632,732 | 39,000,000 | 22,211,216 |
| 306 | 30601 | 530,000,000 | 238,792,923 | 325,000,000 | 457,277,673 | 1,993,000,000 | 753,725,047 |
| 307 | 30701 | 18,000,000 | 17,863,842 | 15,000,000 | 17,533,353 | 100,000,000 | 81,547,823 |

### 2.3.2 ගබඩා අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගබඩා අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ගබඩා අත්තිකාරම් ගිණුමක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 306 | 30602 | 1,700,000,000 | 1,632,141,769 | 1,200,000,000 | 1,215,103,213 | 5,311,000,000 | 4,969,620,204 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ වන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.422,544,996 ක් විය.

## **2 කොටස**

## **එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

## 1. ශීර්ෂය 114 - ප්‍රවාහන අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

ප්‍රවාහන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ප්‍රවාහන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විගණනයට ඉදිරිපත් නොකළ සාක්ෂි**

**I.** අමාත්‍යාංශය විසින් මිලදීගෙන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත ලබාදුන් වාහන බැටරිවලින් රු.3,830,702 ක් වටිනා බැටරි 183 ක් මහනුවර ප්‍රාදේශිකයට භාර දී තිබුණත් එය භාරගත් බවට එම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල මහනුවර ප්‍රාදේසීය කාර්යාලය සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

**II.** ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය විසින් රුහුණු ප්‍රාදේශීය කාර්යාලය වෙත වාහන බැටරි භාරදීමේදී 2011 වර්ෂයේදී රු.1,569,960 ක් වටිනා වාහන බැටරි 75 ක් ද 2012 වර්ෂයේදී රු.3,474,845 ක් වටිනා වාහන බැටරි 166 ක් ද වශයෙන් එකතුව රු. 5,044,805 ක් වටිනා වාහන බැටරි 241 ක් අඩුවෙන් භාර දී තිබුණි.

**(ආ) අයවැය විචලනය**

**(i)** වැය විෂයයන් 12 කට සළසා තිබුණු රු.4,501,800,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ii)** වැය විෂයයන් 29 ක් වෙනුවෙන් අධි ප්‍රතිපාදන සැලසීම නිසා උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සපයා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 ක් හා සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක: පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එය පිළියෙල කර තිබුණේ 2013 පෙබරවාරි 01 දිනදීය.

### 1.4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණන පරීක්ෂණ 07 ක් සිදුකර තිබුණත් මුල් කාර්තුවට අදාලව අභ්‍යන්තර විගණන වාර්තාවක් පමණක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

වර්ෂ 03 කට අධික කාලයක් වාහන 05 ක් නිෂ්ක්‍රීයව හා තවත් වාහන 05 ක් ඌන උපයෝජිතව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක: පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර, එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 ජූනි 28 දින වනවිටත් පවත්වා නොතිබුණි. අවසානවරට භාණ්ඩ සමීක්ෂණයක් 2011 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි. 2012 වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පත්කර තිබුණු අතර සමීක්ෂණ කටයුතු 2014 පෙබරවාරි 28 දින වනවිටද සිදුකරමින් පැවතුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස රු.3,800,000 ක් වටිනා වාහන 03 ක් රජයේ ආයතන 03 ක් වෙත මුදාහැර තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 01 පර්චස් 25.75 ක ඉඩම හා ඒ තුළ වූ කාර්යාල ගොඩනැගිල්ල අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අතර එකතුව රු.5,600,000 ක් වටිනා වාහන 07 ක් බාහිර රජයේ ආයතන වෙතින් ලබාගෙන පරිහරණය කර තිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.313,575,577 ක් වූ අතර, එය වර්ෂයකට අඩු කාලයකට අදාළ විය.

## 1.6 අනුකූල නොවීම්

2010 මැයි 14 දිනැති අංක: සීජ්/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛයට පටහැනිව අමතර දුරකථන හා ෆැක්ස් සම්බන්ධතා 07 ක් හා නිර්වචනය නොවූ තනතුරු 02 ක් සඳහා දුරකථන සම්බන්ධතා 02 ක් ලබා දී එකතුව රු.473,615 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර හා ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම සහ ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ. (පාර්ලිමේන්තුවට වෙන් වෙන් වශයෙන් වාර්තා කරන විදේශාධාර ව්‍යාපෘති හැර)

- **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළයුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වනවිට වියදම | 2012 වර්ෂයේ වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | ......................... | ................ | ............ | ................. | ................ | ............. | ..................................................... |
| | | රු.මිලියන | | | රු.මිලියන | රු.මිලියන | |
| **(i)** | මාතර - කතරගම යෝජිත දුම්රිය මාර්ගය ව්‍යාපෘතිය (බෙලිඅත්ත සිට කතරගම දක්වා) | 92,252.29 | 2006 | 2017 | 1,473.62 | 134.46 | බෙලිඅත්ත සිට කතරගම දක්වා වූ දුම්රිය මාර්ගය සංවර්ධනය කටයුතුවලට අනුකූල වනසේ දැනට තීරණය කර ඇති දුම්රිය මාර්ගය වෙනස් කරන ලෙසට යෝජනා කර ඒ අනුව ඊට අනුරූපවනසේ නව දුම්රිය මාර්ගයක් තෝරාගැනීමේ අධ්‍යයනයක් කරමින් පවතින බව අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි. එය සනාථ කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **(ii)** | මාතර - කතරගම යෝජිත දුම්රිය මාර්ගය ව්‍යාපෘතිය (මාතර සිට බෙලිඅත්ත දක්වා) | 40,533.55 | 2006 | ගිවිසුම්ගත කාලය අවුරුදු 03 ක් වන අතර අත්තිකාරම්මුදල ගෙවන දිනය අනුව නිම කළයුතු දිනය තීරණය වනු ඇත. | | | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හා ව්‍යාපෘතියට අවශ්‍ය ණය ප්‍රතිපාදන ලබාගැනීමට විදේශ ආයතනයක් සමඟ ණය ගිවිසුමක් එළඹීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| **(iii)** | හොරණ - කොට්ටාව යෝජිත දුම්රිය මාර්ගය - ශක්‍යතා අධ්‍යයනය හා පරිසර අධ්‍යයනය | 11.00 | 2006 | 2008. ඔක්තෝ..30 | 6.00 | 2.69 | මොරටුව විශ්වවිද්‍යාලය වෙත එම අධ්‍යයනය සිදු කිරීමට භාරදී තිබූ නමුත් එය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(iv)** | කුරුණෑගල හබරණ හරහා දඹුල්ල යෝජිත දුම්රිය මාර්ගය | 4,000.00 | 2008. අප්‍රේල්.08 | 2009.ජනවාරි.31 | 19.90 | 0.58 | පරිසර කටයුතු කිරීම හා මධ්‍යම රේඛා ලකුණු කිරීම වෙනුවෙන් වියදම් කර තිබුණු අතර එම ගෙවීම් සම්බන්ධයෙන් මිළ සංශෝධනයක් ඉල්ලා තිබුණත් එය ලබා නොදීම මත කටයුතු නවතා තිබුණි. |
| **(v)** | කොළඹ හම්බන්තොට කැළණිවැලි යෝජිත දුම්රිය මාර්ගය - ආර්ථික ශක්‍යතා අධ්‍යයනය සහ පාරිසරික ඇගයීම් වාර්තාව | 5,750.00 | 2008. අප්‍රේල්.08 | 2009.ජනවාරි.31 | 5.40 | වියදම් දරා නැත | මොරටුව විශ්වවිද්‍යාලය වෙත අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා භාරදී තිබූ නමුත්, එය ඉටුකරවා ගැනීමට කටයුතු නොකිරීම. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **(vi)** | මැදවච්චිය ත්‍රිකුණාමලය යෝජිත දුම්රිය මාර්ගය - ශක්‍යතා අධ්‍යයනය | 9.00 | 2010. ජනවාරි.01 | 2012.නොවැ.28 | 4.20 | 4.24 | ශක්‍යතා අධ්‍යයන වාර්තාව පිළියෙල කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය වෙත භාර දී තිබූ අතර, අවසන් වාර්තාව ලබාගැනීමට කටයුතු නොකිරීම. කොළඹ විශ්වවිද්‍යාලය වෙත දරන ලද වියදම් මේ යටතේ ඇතුළත් වේ. |
| **(vii)** | වැල්ලවාය බිබිල බදුල්ල යෝජිත දුම්රිය මාර්ගය - පූර්ව ශක්‍යතා අධ්‍යයනය | 9.00 | 2011. පෙබ..01 | 2012.දෙසැ.30 | - | වියදම් දරා නැත | මෙම දුම්රිය මාර්ගය ඉදිකිරීම සඳහා කැබිනට් අනුමැතිය ඉල්ලා තිබූ නමුත් 2011 දෙසැම්බර් 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම මාර්ගය වෙනස් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව ඇඹිලිපිටිය - මොණරාගල - කතරගම - අම්පාර - මඩකලපුව හරහා දුම්රිය මාර්ගයක් සකස් කිරීමට පූර්ව ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමේ කොන්ත්‍රාත්තුව CECB ආයතනය වෙත පැවරීමට 2012 අප්‍රේල් 05 දින කැබිනට් අනුමැතිය ලැබී ඇතත්, මේ දක්වා ගිවිසුම පැවරීමට කටයුතු නොකිරීම. |
| **(viii)** | ත්‍රිකුණාමලය මාහෝ පුත්තලම යෝජිත දුම්රිය මාර්ගය - මූලික ශක්‍යතා අධ්‍යයනය | 1.00 | 2011. පෙබ.01 | 2012.දෙසැ.25 | 0.10 | 0.11 | ශක්‍යතා වාර්තාව පිළියෙල කිරීමට අවශ්‍ය මූලික වාර්තාව පිළියෙල කිරීමට කටයුතු නොකිරීම. |

## 1.8 පාඩු හා හානි

වාහන අනතුරු සිද්ධීන් 06 කට අදාලව එකතුව රු.2,062,819 ක අලාභහානි සිදු වී තිබූ අතර, ඉන් රු.346,200 ක අලාභහානි 2012 දෙසැම්බර් 31 දින වන විට අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.9 අනාර්ථික ගනුදෙනු

2010.09.01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර සෘජු දුරකථන සම්බන්ධතා නිලධාරීන් 28 දෙනෙකු වෙත ලබා දී තිබුණි.එම නිලධාරීන් විසින් එකතුව රු.507,065 ක් දුරකථන ඇමතුම් තම සෘජු දුරකථනයෙන් ලබා නොගෙන අමාත්‍යාංශයේ පොදු දුරකථනයෙන් ලබාගෙන තිබුණි. මේ නිසා එම නිලධාරීන්ගේ දුරකථන වියදම් සීමාව ඉක්මවීම වලක්වාගෙන තිබුණි.

## 1.10 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 25 | 20 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 05 | - |
| (iii) | ද්විතියක මට්ටම | 107 | 70 | 37 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 45 | 41 | 4 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | **එකතුව** | **185** | **139** | **46** |

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදේශක පත්වීම් ලැබූ සේවකයින් 50 කට වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහන අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි. ඔවුන් අමාත්‍යාංශයට මුදාහල දිනයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා අතිකාල ලෙස දුම්රිය දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.1,418,383 ක් ගෙවා තිබුණි.එම මුදල අමාත්‍යාංශය විසින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත 2012 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූරණය කර නොතිබුණි.

## 2. ශීර්ෂය 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වර්තාව 2013 ඔක්තෝබර් 10 දින ශ්‍රී ලංකා දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලනරෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (එ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන 2013 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය/ආදායම් සංකේතය/විෂය අංකය | ගිණුමේ නම | ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| 306 | විසර්ජන ගිණුම | 2013 ජූලි 18 |
| 20:01:01:00 | ආදායම් ගිණුම | 2013 අප්‍රේල් 09 |
| 30601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය | 2013 අප්‍රේල් 26 |
| 30602 | ගබඩා අත්තිකාරම් ගිණුම | 2013 මැයි 10 |

**(ආ)** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**(i)** ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලැයිස්තු, උපලේඛන හා වාර්තා පිළියෙල කර නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| අර්ධ වාර්ෂික තැන්පත් ලැයිස්තුව | මුදල් රෙගුලාසි 571 (1) | පිළියෙල කර නොතිබුණි. |
| හිගහිටි කේවල ණය ශේෂ උපලේඛන | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | - එම - |

**(ii)** සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 50 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 23 කට 2013 මාර්තු 31 දින වනවිටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.19,546,573,929 ක් විය.

**(ඇ)** **රාජ්‍ය වියදම් කළමනාකරණය**

**(i)** 2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සළසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව මූලධන වියදම් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 9 ක ප්‍රතිපාදන අවුරා තැබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් සියයට 6.2 ක් ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණක් අවුරා තබා තිබුණි.

**(ii) අයවැය විචලනය**

----------------------

* වැය විෂයයන් 10 ක් සඳහා සළසා තිබුණු රු.994,090,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

* වැය විෂයයන් 25 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 99 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** රත්මලාන කොතලාවලපුර පිහිටි දුම්රිය ක්‍රීඩාංගනය කුලියට දීමෙන් ලැබී තිබූ රු.57,400 ක් වූ ආදායම රජයේ ආදායමට බැර කර නොතිබුණි. එම ක්‍රීඩාංගනයේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට දුම්රිය ආරක්ෂක අංශ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ii)** දුම්රිය ස්ථානවල පිහිටි වෙළෙඳ සැල් 07 කින් අයවිය යුතු රු.302,582 ක ආදායමක් අයකර ගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| | දුම්රිය ස්ථානය | පිහිටි වෙළෙඳ සැල් සංඛ්‍යාව | හිඟ මුදල |
|---|---|---|---|
| | | | රු. |
| (i) | මීරිගම | 1 | 26,880 |
| (ii) | ජාඇල | 1 | 40,200 |
| (iii) | මහරගම | 5 | 235,502 |
| | **එකතුව** | **7** | **302,582** |

**(iii)** ආදායම් සංකේතාංක 20:01:01:00 දරන ආදායම් ගිණුම අනුව රු.1,263,848,467 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 38 ක කාල පරාසයකට අදාල විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. හිඟ හිටි ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **කාල විශ්ලේෂණය** | | | **2012 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම්** |
|---|---|---|---|---|
| | **වර්ෂ 1 ට අඩු** | **වර්ෂ 1 ට වැඩි 2 ට අඩු** | **වර්ෂ 3 ට වැඩි** | |
| .................. | ................. | ................ | ................... | .................... |
| | **රු.** | **රු.** | **රු.** | |
| 20:01:01:00 | 664,132,149 | 94,605,988 | 505,110,330 | 1,263,848,467 |

**(iv)** මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව හිඟහිටි ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

**(v)** දෙපාර්තමේන්තුව සතු භූමිය තුළ සවිකළ දුරකථන කුටි 117 ක් වෙනුවෙන් රු.5,958,975 ක ගාස්තුවක්ද දුම්රිය ස්ථානවල සවිකර තිබූ ටෙලර් යන්ත්‍ර 10 ක් වෙනුවෙන් රු.19,578,000 ක ගාස්තුවක්ද සමාලෝචිත වර්ෂයේදී අයවිය යුතුව තිබුණි.

**(vi)** කොළඹ කොටුව භෝජනාගාර ඒකක අංක 01 හා කොළඹ කොටුව/මහනුවර ඒකක 02 දෙපාර්තමේන්තුව විසින් 2009 පෙබරවාරි මාසයේ සිට පෞද්ගලික ආයතනයක් වෙත බදු දීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟහිටි විදුලි ගාස්තුව රු.1,221,100 ක් හා ප්‍රමාද ගාස්තුව වූ රු.441,900 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(vii)** මීගමුව භෝජනාගාරය ලංසු කැඳවීමකින් තොරව මාසිකව රු.6,500 කට 2010 ජූනි 01 දින බදු දී තිබුණු අතර 2011 අගෝස්තු වන විට හිඟ බදු කුළිය රු.44,446 විය. මෙම භෝජනාගාරය මීට පෙර බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු.22,629 ක මුදල් ද හිඟව පැවති අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මෙම භෝජනාගාරයෙන් ලැබිය යුතු හිඟ බදු කුළිය රු.70,075 ක් විය.

**(viii)** දෙපාර්තමේන්තුව විසින් 2006 ජනවාරි 01 දින පදනම් කරගෙන සකස් කර තිබුණු සංශෝධිත බදු කුලී දැන්වීම් නිකුත් කර ඇති කඩ කාමර 16 කින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟ බදු කුලී ආදායම රු.4,880,013 ක් විය. තවද එම කඩකාමර පවරා ගැනීම සඳහා නෙරපීමේ දැන්වීම් නිකුත් කර තිබුණද ඔවුන් ඉවත් වී නොතිබුණි.

**(ix)** 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වේයන්ගොඩ, නුගේගොඩ, පාදුක්ක සහ මහරගම යන දුම්රිය ස්ථානවලින් අයවිය යුතු කඩකාමර කුලිය රු.1,519,271 ක් වී තිබුණි.

**(x)** 2011 වර්ෂයේදී ශ්‍රවනාගාර කුළියට දීමෙන් ලද රු.67,500 ක ආදායම හා 2012 වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු. 132,500 ක් රජයේ ආදායමට බැර නොකර විධිමත් අනුමැතියකින් තොරව ඉතිරිකිරීමේ ගිණුමක රඳවාගෙන තිබුණි.

**(xi)** බදුල්ල මහ නගර සභාවට බදු දී තිබූ ඉඩම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අයවිය යුතු හිඟ කුළීය රු.602,274 ක් වී තිබුණි.

**(xii)** බණ්ඩාරවෙල දුම්රිය ස්ථානයට අයත් පර්චස් 7.65 ක් වූ ඉඩම රජයේ බැංකුවකට නැවත බදුදීමේදී 2007 වර්ෂයේ නව තක්සේරු වටිනාකම මත බදුකුලී අයකර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දෙපාර්තමේන්තුවට අහිමි වූ බදුකුලිය රු.350,000 ක් විය.

**(xiii)** ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට බදු දී තිබුණු ඉඩම් 32 කට අදාලව 2007 වර්ෂයේ සිට අයකරගත යුතු බදු ආදායම රු.මිලියන 205.93 ක් විය.

**(xiv)** දෙපාර්තමේන්තුව සතු වෛයිස්රෝයි දුම්රිය පෞද්ගලික ආයතනයකට බදු දීමෙන් පසු එහි වාර්ෂිකව සිදුවන නඩත්තු කටයුතු වෙනුවෙන් එම ආයතනය වෙතින් අයවිය යුතු රු.6,092,801 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(xv)** දිගුකාලයක සිට දෙපාර්තමේන්තුව සතු මවුන්ට් මේරි ක්‍රීඩාංගනය බදු දීමෙන් ලැබෙන ආදායම රජයේ ආදායමට බැර නොකර විධිමත් අනුමැතියක් රහිතව පෞද්ගලික බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. 2011 වර්ෂයේදී රු.1,719,902

ක ආදායමක් ලැබී තිබුණි. එම ආදායම පිළිබඳ කිසිදු තොරතුරක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** විෂය අංක 30601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.74,184,173 ක් වී තිබුණි. එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවති අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. හිඟහිටි ණය ශේෂ වලින් සියයට 63 ක් හෙවත් රු.46,512,602 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂ විය.

**(ii)** දෙපාර්තමේන්තු පොත් අනුව හා මහා භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත අනුව පාලන ගිණුම් හේෂය රු.4,177,805 ක් 2004 වර්ෂයේ සිට පැවත එන නමුත්, එය සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(iii)** කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ හා පාලන ගිණුමේ ශේෂයන් අතර රු.11,957,423 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(iv)** දුම්රිය දෙපාර්තමේන්තුවේ සිට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 8 කට වඩා පැරණි රු. 1,098,535 ක ණය ශේෂය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(v)** උප කාර්යාල 18 කට අදාලව මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් ලබාගත් එකතුව රු.39,178,803 ක් ණය ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.5,4.4 හා 4.5 ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(vi)** ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුවන්ගෙන් අයකරගත නොහැකි අවස්ථාවලදී ඔහු සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ගය ඇපකරු සම්බන්ධයෙන්ද අනුගමනය කර එම මුදල්, ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද,

සේවය හැරගිය උප දෙපාර්තමේන්තු 08 කට අදාළ සේවකයින්ගෙන් රු.22,258,450 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(vii)** උප දෙපාර්තමේන්තු 15 ක වැඩ තහනම් කරනු ලැබූ සේවකයින්ගෙන් අය නොවන දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු.10,647,963 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(viii)** සේවයෙන් පහකළ සේවකයින්ගෙන් වසර 10 කට අධික කාලයක සිට හිඟ හිටව පැවත එන රු.235,701 ක ණය ශේෂය අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ix)** දිස්ත්‍රික් ඉංජිනේරු (පහල) ගාල්ල උප කාර්යාලයෙහි වෙනත් ශේෂ ලෙස රු.535,780 ක් සැසඳුම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණත් එම ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඊ) ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම්**

---------------------------------------

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 1987 දෙසැම්බර් මාසයේදී ඇවර කිරීමේ කටයුතු නිමකර තිබුණු අත්තිකාරම් ගිණුම් 04 ක් පැවති අතර, එම අත්තිකාරම් ගිණුම්වල පැවති කාරක පාඩුවල එකතුව රු.3,394,553 ක් විය. ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**(උ) ගබඩා අත්තිකාරම් ගිණුම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** භාණ්ඩ මිලදීගැනීම සඳහා 1980 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා එකතුව ලබා දී තිබුණු අත්තිකාරම් වලින් 2012 දෙසැම්බර් 31 වන විට ලබා දී තිබුණු නිරවුල් කර නොතිබුණු අත්තිකාරම්වල එකතුව රු.63,787,848 ක් වී තිබුණි. 2012 වර්ෂයේදී අත්තිකාරම් වලින් එකතුව රු.12,621,901 ක් වූ අත්තිකාරම් 2013 ජුනි වනවිටත් නිරවුල් කර නොතිබුණි.

**(ii)** 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාණ්ඩ ආනයනයේදී රේගු ගාස්තු වශයෙන් රු.114,384,708 ක් වැයකර තිබුණත්, එම පාඩුව තොගයට ගලපා නොතිබුණි.

**(iii)** 1998 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා නිරවුල් නොකළ ණයවර ලිපිවල වටිනාකම රු.67,372,861 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දින වන විටත් එම වගකීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(iv)** යල්පැන ගිය හා අභාවිත ද්‍රව්‍යවලින් උද්ගත වූ පාඩු වශයෙන් රු.13,829,758 ක් වර්ෂ ගණනාවක සිට ගිණුම්වල ඉදිරියට ගෙනවිත් පැවතුනද, එම පාඩු තොගවලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

**(v)** ගිණුම් සමඟ ඉදිරිපත් කළ ණයහිමි උපලේඛනයේ රු.131,433,982 ක් වූ ණයහිමි ශේෂයේ අන්තර්ගත වී ඇත්තේ 1996 වසරේ සිට 2011 වසර දක්වා වූ ණය හිමියන් වන අතර එම ශේෂයෙන් භාණ්ඩ ලබා ගැනීමට ප්‍රථමයෙන් එම ආයතන වලට ගෙවා අත්තිකාරම් ලෙස අඩුකල රු.9,184,686 ක් වූ වටිනාකම තුළ එම කාල පරිච්ඡේදයට අදාල නොවූ 1992 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා ගෙවූ රු.3,916,998 ක අත්තිකාරම් මුදල ද ඇතුළත්ව තිබුණි.

**(vi)** රත්මලාන ගබඩාව සඳහා 2012 පෙබරවාරි 09 දින රු.2,177,448 ක් වැය කර බැටරි (Mono Black Lead Battery (Dong – Ah – N 2002 12v, 215 Ab with Aid) 39 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. එම බැටරිවල වගකීම් කාලය වසරක් වූ අතර විගණිත දිනය වූ 2013 ජනවාරි 07 දින වන විටත් එම බැටරි තොගය භාවිතයට නොගෙන ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

**(vii)** අවශ්‍යතාවය හඳුනා නොගෙන මරදාන ගබඩාව සඳහා 2012 ජනවාරි 12 දින රු.579,999 ක් වැය කර කළු වර්ණයෙන් යුත් 17" x 11" ලෙදර් බෑග් 200 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි.මිලදී ගත් බෑග් 200 න් විගණිත දිනය වූ 2013 ජනවාරි 11 දින වන විට භාවිතයට බෑග් 31 ක් පමණක් නිකුත් කර තිබුණු අතර භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව පැවති බෑග් 178 ක වටිනාකම රු.561,199 ක් විය.

**(viii)** 2012 ජූලි මාසයේදී රත්මලාන ගබඩාවට මුද්‍රණ යන්ත්‍ර (Fascimiles Printer) 07 ක් විධිමත් පරිදි භාරගෙන තිබුණි.එහි වටිනාකම රු.203,840 ක් විය.2012 ඔක්තෝබර් 07 දින වන විටත් එම මුද්‍රණ යන්ත්‍ර කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ තබා තිබුණි.

**(ix)** RJ/25/3 දරන තොග අයිතමය එකවර මිළදී ගැනීමෙන් තොරව අවස්ථා 06 කදී වරින් වර මිලදී ගැනීම නිසා ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු වී නොතිබුණි.එමගින් සිදු වූ ගණනය කළ අලාභය රු.105,921 ක් විය.

**(x)** ගිණුම් අංශයේ පවත්වාගෙන යනු ලබන ලේඛනවලට අනුව 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා විදේශීය සමාගම්වලින් අවස්ථා 360 කදී ඇණවුම් කළ එකතුව රු.573,481,923 ක් වටිනා භාණ්ඩ මාර්ගස්ථ තොග ලෙස දක්වා තිබුණි. ණයවර ලිපි මගින් ගෙවීම් කර තිබුණු මෙම තොග නොලැබීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(xi)** 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා විදේශීය සැපයුම්කරුවන්ට රු.159,561,864 ක් ගෙවා තිබුණු නමුත් අවස්ථා 35 කදී එකතුව රු.105,299,195 ක් වටිනා ඇණවුම් කළ භාණ්ඩ ලැබී නොතිබුණි.

**(ඖ) අග්‍රිම ගිණුම්**

**I.** අග්‍රිම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම ගිණුමක් නඩත්තු කිරීමක් හෝ අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ මාසිකව සැසඳීමක් හෝ කර නොතිබුණි.ඒ වෙනුවෙන් ණය ගිණුමක් ලෙස අංක 8003 යටතේ දුම්රිය සාමාන්‍යාධිකාරී නමින් ගිණුමක් පවත්වා තිබුණි.

**II.** මුදල් රෙගුලාසි 371 (ඇ) ප්‍රකාරව අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත්, 2010 හා 2011 වර්ෂවලදී ලබාගත් රු.102,602,082 ක තත්කාර්ය අතුරු අග්‍රිම 2013 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**(එ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.216,664,689 ක් වී තිබුණි. වර්ෂ 2 ක් ඉක්ම වූ රු.29,967,732 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2013 අගෝස්තු 27 දින පිළියෙල කර තිබුණි.

### 2.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 2.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 වර්ෂයේ සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ ක්‍රියාකාරී සැලැස්ම 2013 අගෝස්තු 17 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

### 2.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 2.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 402(1) ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය

අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින වන විටත් විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**2.4.5 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණි. එම අංශයේ නිලධාරීන් 23 කින් සමන්විත වී තිබුණද මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.4.6 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද, 2012 වර්ෂයේදී රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ප්‍රමාණය | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | ඉඩම් (අක්කර) | 1490 | වර්ෂ 25 ට වැඩි |
| (ii) | මෝටර් වාහන (කාර්) | 01 | වර්ෂ 10 ට වැඩි |
| (iii) | බස් රථ | 01 | වර්ෂ 10 ට වැඩි |
| (iv) | යන්ත්‍ර සූත්‍ර හා එන්ජින් | 43 | වර්ෂ 25 ට වැඩි |

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ගබඩා සමීක්ෂණ වාර්තා අනුව එකතුව රු.241,513 ක් වූ භාණ්ඩ අයිතම 13 ක අතිරික්තයක් හා වටිනාකම ගණනය නොකළ භාණ්ඩ අයිතම 05 ක අතිරික්තයක් අනාවරණය වී තිබුණි.එම තොග අතිරික්ත වටිනාකම ගබඩා අත්තිකාරම් ගිණුමේ වූ තොග ශේෂයට ගැලපුම් කර නොතිබුණි.ඒ නිසා එම වටිනාකමෙන් තොග වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

**(ii)** භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එකතුව රු.14,860,600 ක් වූ අයිතම 268 ක ඌනතාවක් හා වටිනාකම ගණනය නොකළ භාණ්ඩ අයිතම 20 ක ඌනතාවයක් අනාවරණය විය. එම තොග ඌනතාවය අවසන් තොග වටිනාකමට නොගැලපීම හේතුවෙන් ගබඩා අත්තිකාරම් ගිණුමේ තොග ශේෂය ඊට අදාල අගයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර, එම ඌනතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(iii)** 2010 හා 2011 වර්ෂවලදී ද භාණ්ඩ සමීක්ෂණ අනුව නිරීක්ෂණය වූ අතිරික්ත හා ඌනතා තොගයට නොගැලපීම් සම්බන්ධයෙන් පසුගිය වර්ෂවලදී විගණන විමසුම්වලින් පෙන්වා දී තිබූ නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| **වර්ෂය** | **අතිරික්තය** | | **ඌනතාවය** | |
|---|---|---|---|---|
| ........ | ........................................... | | .................................. | |
| | **අයිතම ගණන** | **වටිනාකම** | **අයිතම ගණන** | **වටිනාකම** |
| | .......... | .................................. | ......... | ........................ |
| | | **රු.** | | **රු.** |
| 2010 | 14 | 212,420 | 232 | 9,860,577 |
| | 10 | වටිනාකම දක්වා නොමැත | 59 | වටිනාකම දක්වා නොමැත |
| 2011 | 13 | 162,471 | 196 | 10,841,638 |
| | 03 | වටිනාකම දක්වා නොමැත | 17 | වටිනාකම දක්වා නොමැත |

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබූ වත්කම්**

---------------------------------------------------

වටිනාකම රු.600,000 ක් වූ ඉඩම් අක්කර 01 පර්.25.75 ක් දෙපාර්තමේන්තුව විසින් ප්‍රවාහන අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

------------------------------

දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දින වන විට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු බැරකම්වල වටිනාකම රු.714,140,579 ක් විය.

## 2.6 අනුකූල නොවීම්

---------------------

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

----------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| (අ) | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ආයතන සංග්‍රහය | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | VIII වැනි පරිච්ඡේදයේ 5.6 වගන්තිය | 4,123,595 | සේවාමුර හෝ වැඩමුර අනුව සේවයේ යොදවා ඇති නිලධාරීන්ට සතියකට අවම වශයෙන් පැය 168 ක් අඩු නොකර නියාමකවරු 101 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී අතිකාල ගෙවා තිබුණි. |
| (ii) | VIII වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය | 2,312,328 | මරදාන දුම්රිය ප්‍රධාන නියාමකවරුන්ට පැය 10165 ක නිෂ්ක්‍රීය කාලය සඳහා අතිකාල ගෙවා තිබුණි. |
| (iii) | VIII වැනි පරිච්ඡේදයේ 1.4 වගන්තිය | 418,312 | අති විශේෂ තත්ත්වයක් නොමැතිව, සුපරික්ෂාකාරී නොවී හා නොකඩවා පාලනයක් නොයෙදීම මත ඇබෑර්තු පැවති තනතුරු ආවරණය සඳහා අවශ්‍ය මිනිස් පැය ප්‍රමාණයට වඩා මිනිස් පැය 3194 ක් වෙනුවෙන් අතිකාල ගෙවා තිබුණි. |
| (iv) | XII වැනි පරිච්ඡේදයේ 6.2 වගන්තිය | 84,355 | නිලධාරීන් 06 දෙනෙකු විසින් පෞද්ගලික වෛද්‍ය සහතික ඉදිරිපත් කර එක් වරකදී ලබාගත හැකි නිවාඩු දින 14 ඉක්මවා දින 121 ක් නිවාඩු ලබාගෙන තිබුණි. |
| (v) | XXX වැනි පරිච්ඡේදයේ 1.4 වගන්තිය හා IX වැනි පරිච්ඡේදයේ 3 වැනි වගන්තිය | 117,650 | නිලධාරියෙකු තම සාමාන්‍ය රාජකාරී කටයුතුවලට පරිබාහිර වූ යම්කිසි කාර්යයක් ඉටු කරදීමට භාරගැනීමට ප්‍රථම ලේකම්වරයාගේ අවසරය ලබා ගතයුතු වුවත්, නිලධාරීන් දෙදෙනෙක් ක්‍රිකට් විනිසුරුවරුන් ලෙස සහභාගී වී දීමනා ලබාගැනීම හා එම දීමනාවෙන් ලේකම්වරයා නියම කරන යම් සියයට ගණනක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(vi)** | XXIV පරිච්ඡේදයේ 4.8 වගන්තිය | 153,924 | දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 04 කගෙන් අයවිය යුතු වසර 10 කට වඩා පැරණි ණය ශේෂ අයකර ගැනීමකින් තොරව රාජ්‍ය සංස්ථා වලට මුදා හැර තිබුණි. |
| **(vii)** | ii වැනි කාණ්ඩයේ I වැනි පරිශිෂ්ඨයේ (2) ඡේදය | 3,898,568 | ව්‍යාජ වෛද්‍යවරුන්ගේ නම් හා ලියාපදිංචි අංකයන් යොදා සකස් කල සාවද්‍ය වෛද්‍ය සහතික ඉදිරිපත් කර නිවාඩු දින 5664 ක් ලබාගෙන තිබුණි. එම මුදල් අයකර ගැනීමට හා එම ලේඛන සකස් කර තිබූ අයට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් හෝ ගෙන නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| **(i)** | මුදල් රෙගුලාසි 105 | 20,702,215 | දෙපාර්තමේන්තුවේ රු.20,702,215 ක භාණ්ඩ අයිතම් 504 ක ඌණතාවයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ii)** | මුදල් රෙගුලාසි 175(2) | 57,660,420 | විධිමත් ලෙස හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(iii)** | මුදල් රෙගුලාසි 371 (2) | 137,857,000 | තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදුන් විට දෙන ලද කාර්යය නිම වූ වහාම එය පියවිය යුතු වුවත් 2011 වර්ෂයේදී අවස්ථා 2204 කදී දෙන ලද අත්තිකාරම් රු.137,857,000 ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. |
| **(iv)** | මුදල් රෙගුලාසි 571 (1)(2)(3) | 29,327,971 | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් සියළුම තැන්පතු ලැයිස්තු පිළියෙල කර රාජ්‍ය ආදායමට බැර කළයුතු අතර නැතහොත් හැකි ඉක්මණින් |

| | | | |
|---|---|---|---|
| | | | ආපසු ගෙවිය යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් එසේ රාජ්‍ය ආදායමට බැර නොකළ ඉකුත් තැන්පතුවල වටිනාකම රු.29,327,971 ක් විය. |
| **(v)** | මුදල් රෙගුලාසි 751 | 500,202 | උතුරු දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි. |
| **(vi)** | මුදල් රෙගුලාසි 760 හා 110 | 35,562,815 | භාණ්ඩ නැතිවීම නැතහොත් අඩුවීම සම්බන්ධයෙන් එම වටිනාකම බඩු ලේඛන පොත්, තොග පොත් ආදියෙන් අස්කළ යුතු වුවත්, 2010 සිට 2012 දෙසැම්බර් 31 දක්වා නිරීක්ෂණය වූ තොග ඌනතා සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| **(vii)** | මුදල් රෙගුලාසි 767 | 616,401 | 2010 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා නිරීක්ෂණය වූ තොග අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 145,089 | ජනාධිපති ලේකම් කාර්යාලීය චක්‍රලේඛයට පටහැනිව ප්‍රවාහන අමාත්‍යාංශයට පත්කළ සම්බන්ධීකරණ ලේකම්වරයෙකුට දුම්රිය දෙපාර්තමේන්තු ශීර්ෂය මගින් වාහන අළුත්වැඩියා වියදම් ලෙස රු.145,089 ක් හා මාසිකව ලබාදුන් ඉන්ධන ලීටර 340 ක් වෙනුවෙන් වැයකළ ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. |
| **(ඈ)** | **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** | | |
| **(i)** | 2006 සැප්තැම්බර් 27 දිනැති අංක 187/2006 චක්‍රලේඛයේ 03 හා 04 ඡේද | 391,297,515 | දෛනිකව රැස්කරනු ලබන ආදායම් වාර්තා හා මාසික ආදායම් වාර්තා භාණ්ඩාගාරයේ පොත් සමඟ සැසඳීම් කර නිවැරදි කළයුතු වුවත් සමාලෝචිත |

| | | | |
|---|---|---|---|
| | | | වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.391,297,515 ක් වූ ශේෂයන්ගේ වෙනස සැසඳීම් කර නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| **(ii)** | 2004 ඔක්තෝබර් 14 දිනැති අංක 174 දරන චක්‍රලේඛය | 2,777,000 | 2004 න් පසුව මිලදීගත් ජංගම නොවන වත්කම් අපහරණයන් ආරම්භක ශේෂයෙන් ඉවත් කර පෙන්විය යුතු අතර ඊට පෙර අත්පත් කරගත් වත්කම් ආරම්භක ශේෂයෙන් අඩුනොකර පෙන්විය යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් මිලදීගත් රු.2,777,000 ක් වටිනා වත්කම්වල මිලදී ගත් වර්ෂය සනාථ කරගෙන නොතිබුණි. |
| **(ඉ)** | **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** | | |
| | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010 දරන චක්‍රලේඛය | 17,237,090 | 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වරින්වර විදේශගත වූ නිලධාරීන් 129 දෙනෙකු සඳහා කළ ගෙවීම් වැය ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණි. |
| **(ඊ)** | **දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිකුත් කළ චක්‍රලේඛ** | | |
| | 20111 නොවැම්බර් 23 දිනැති අංක ව.ආ/පොදු/2011/09 දරන චක්‍රලේඛය | 1,783,818 | දුම්රිය හරස් මාර්ගයේ සවිකර ඇති දුම්රිය ගේට්ටු වලට හානි කිරීම වෙනුවෙන් අලාභය සිදුකළ පාර්ශවයෙන් රු.25,000 ක දඩයක් අය කළයුතු වුවත්, අවස්ථා 78 කදී එසේ සිදුකල අලාභ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

**2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැඳි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළයුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|---|
| | | රු. | | |
| **(i)** | දුම්රිය මැදිරි සෑදීමේ ව්‍යාපෘතිය | 30,000,000 | සඳහන් කර නොමැත. | ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි හේතුන් නිසා බව දක්වා තිබුණත්, එයට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ii)** | පොල්ගහවෙල සිට අනුරාධපුරය දක්වා ද්විත්ව මාර්ගය ඉදිකිරීම | 1,000,000 | සඳහන් කර නොමැත. | එම |
| **(iii)** | පාලම් ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/බෙල්ජියම් රජය) | 214,765,785 | සඳහන් කර නොමැත. | ණය ගිවිසුම 2013 අගෝස්තු මාසයේදී අත්සන් කිරීම නිසා 2012 වර්ෂය සඳහා වියදම් කර නොතිබුණි. |
| **(iv)** | - එම - | 250,000,000 | එම | 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව රු.249,000,000 ක් අවුරා තබා තිබුණි. |

(ආ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| **(i)** | රාගම/පුත්තලම ද්විත්ව මාර්ගය ඉදිකිරීම | 40,000,000 | සඳහන් කර නොමැත | සඳහන් කර නොමැත | 8,873,037 | මැණුම් නිලධාරී පුරප්පාඩු නොපිරවීම |
| **(ii)** | මහනුවර/පේරාදෙණි/ කඩුගන්නාව දුම්රිය ත්‍රිකෝණය සංවර්ධන ව්‍යාපෘතිය | 15,000,000 | සඳහන් කර නොමැත | සඳහන් කර නොමැත | 2,244,683 | එම |
| **(iii)** | කොළඹ මාතර දුම්රිය වැඩිදියුණු කිරීම ශ්‍රී ලංකා රජය/ ඉන්දියානු රජය | 700,000,000 | සඳහන් කර නොමැත | සඳහන් කර නොමැත | 225,529,205 | ඇතැම් අත්‍යාවශ්‍ය වාර්තා තවමත් නොලැබීම |

**2.8 බැංකු ගිණුම් මෙහෙවීමේ අඩුපාඩු**

**(අ) ගැලපුම් කළයුතු ශේෂ**

දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස 01 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | | රු. | රු. | රු. | |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 52,700 | -- | -- | 52,700 |
| (ii) | අගරු චෙක්පත් | 220,220 | 11,820 | 953,699 | 1,185,739 |

**2.9 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් දුර්වලතාවන් නිරීක්ෂණය විය.

(අ) රත්මලාන පිහිටි දුම්රිය නිල නිවාස 236 ක් වෙනුවෙන් ජල සම්බන්ධතා වෙනම ලබා දී නොතිබුණු අතර ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රධාන ජල සැපයුමෙන් ජලය ලබා දී තිබුණි. එමගින් නිවාස 36 ක් වෙනුවෙන් ජල සම්බන්ධතා ලබාගැනීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපහන මණ්ඩලයට 2010 දෙසැම්බර් මාසයේදී රු.2,300,000 ක් ගෙවා තිබුණත් විගණිත දිනය වූ 2012 ඔක්තෝබර් මාසය වන විටත් එම කාර්යය ඉටුකර නොතිබුණි.

**(ආ)** පකිස්ථාන ණය ගිවිසුම් අංක එස්ආර්එස්/එෆ් 6604 යටතේ 2011 නොවැම්බර් 21 දින මිලදී ගත් ඉන්ධන ප්‍රවාහන ටැංකි 15 ක් වරාය වෙත ලැබීමෙන් පසු ඒවා පරීක්ෂාවේදී ඒවායේ මතුපිට පෙන් වූ අඩුපාඩු සකස් කිරීම සඳහා එක් ටැංකියකට රු.310,108 බැගින් රු.4,651,620 ක් වැයකර තිබූ අතර ඒවා නිෂ්පාදකයාගෙන් අයකර ගැනීමට පියවරගෙන නොතිබුණි. ගිවිසුමේ 11.3 වගන්තිය ප්‍රකාර නිෂ්පාදනය කර සපයන ලද ටැංකිවල ඇති කාර්මික හෝ ඉංජිනේරුමය දෝෂයන් සඳහා ශ්‍රී ලංකාව තුළදී කරන ලද අළුත්වැඩියාවන් වෙනුවෙන් දරන ලද වියදම් අයකර ගතහැකි වන්නේ අදාල ටැංකි මෙරට තුළ වාණිජ කාර්යය සඳහා යෙදවීමේ දින සිට මාස 24 ක් හෝ මෙරට වරායට ගොඩබෑමේ දින සිට මාස 30 ක් ඇතුළත දී වුවත්, දැනට එම ටැංකි මෙරටට ආනයනය කර මාස 23 ක් ගත වී තිබූ නමුත් විගණිත දිනය වූ 2012 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

**(ඇ)** කොළඹ කොටුව මහනුවර අතර නගරාන්තර සීඝ්‍රගාමී දුම්රියට වායු සමීකරණ මැදිරි එක් කිරීමේ ගිවිසුම්වලට එළැඹීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු නොකිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබානොගැනීම, එම මැදිරි බාහිර පාර්ශවයන්ට බදුදීමේ ගණුදෙනු විනිවිද භාවයෙන් තොරව සිදු කර තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 702 ප්‍රකාරව අනුමත කළ ආකෘතිවල ගිවිසුමට එළැඹී නොතිබීම නිසා රු.40,870,160 ක හිඟ ආදායම් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට නොහැකි වී තිබුණි.

**(ඈ)** බදු ඔප්පු 02 කින් 2012 අගෝස්තු වන විට ලැබිය යුතු හිඟ බදු කුලී ආදායම රු.643,435 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ)** මුදල් රෙගුලාසි 323 ප්‍රකාර රාජ්‍ය මුදල් අයථා පරිහරණය නොකළයුතු වුවත් දෙපාර්තමේන්තුවේ දෛනික ආදායම් බැංකුගත කිරීමෙන් තොරව වෘත්තිය සමිති මගින් එම සාමාජිකයන් වෙත ලියන ලද පුද්ගලික චෙක්පත් දුම්රිය ස්ථානාධිපතිවරු විසින් මාරු කිරීම් කර තිබුණි. මේ නිසා 2012 වර්ෂයේදී එම සමිති ලබාදුන් වටිනාකම රු.385,000 ක් වූ චෙක්පත් 08 ක් අගරු වී තිබූ බව නිරීක්ෂණය විය. මෙම දෛනික ලැබීම් තුළ චෙක්පත් ලැබීම් හඳුනාගත හැකි ආකාරයට ලේඛන පවත්වා නොතිබුණි.

**(ඊ)** මුදල් රෙගුලාසි 763 ප්‍රකාර විශාල ප්‍රමාණ වශයෙන් ගබඩා තබා ගන්නා දෙපාර්තමේන්තු විසින් භාණ්ඩ නිෂ්පාදනයෙහි හෝ අළුත්වැඩියාවෙහි හෝ නියුක්තව ඇති දෙපාර්තමේන්තු විසින් ව්‍යවස්ථා සම්පාදනය කළයුතු අතර ඒ අනුව දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඇසිටිලින් වායුම මිලදී ගැනීමේදී ඒවා කිරා මැන බැලීමකින් තොරව භාර ගැනීම සිදු කර තිබුණි. 2011 වර්ෂයේදී මෙම අඩුපාඩුව විගණනයේදී පෙන්වාදී තිබුණත් එය නිවැරදි කිරීමෙන් තොරව 2012 අගෝස්තු මාසය වන විටත් රු.4,467,855 ක් වටිනා ඇසිටිලින් වායුව කිරා මැන බැලීමෙන් තොරව මිලදී ගෙන තිබුණි. මේ නිසා ලබාගන්නා ලද ප්‍රමාණය නිවැරදිද යන්න තහවුරු කරගැනීමට විගණනයේදී නොහැකි වූ අතර වැරදි හා වංචා සිදුවීමේ අවධානමක් පවතී.

**(උ)** වෘත්තීය සමිති 02 ක් සඳහා වර්ග අඩි 8642 ක් වූ කාර්යාල 15 ක්ද, වෘත්තීය සමිතියක් ලෙස ලියාපදිංචි නොවූ ආයතන 02 ක් සඳහා වර්ග අඩි 1435 ක් වූ ගොඩනැගිලි 02 ක්ද ලිඛිත ගිවිසුමකින් තොරව මෙම ගොඩනැගිලි, ජලය හා විදුලිය පහසුකම් සඳහා වූ ගාස්තු අයකිරීමකින් තොරව භාවිතයට ලබා දී තිබුණි.

**(ඌ)** දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනයේදී නැති වූ භාණ්ඩ සම්බන්ධයෙන් රු.138,068 ක වන්දි ගෙවා තිබුණත් එයින් රු.110,454 ක මුදලක් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණු අතර ඔවුන්ට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

**(එ)** මරදාන දුම්රිය අංගනයට අනුයුක්තව සිට 2011 හා 2012 වර්ෂවල විශ්‍රාම ලැබූ නියාමකවරු 12 දෙනෙකු විසින් වංචනිකව පිළියෙල කළ වෛද්‍ය සහතික මත ලබාගත් නිවාඩු දින 354 ක් සඳහා අයවිය යුතු රු.301,251 ක මුදලක් ඔවුන් විශ්‍රාම යාමේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඒ)** ටිකට් පරීක්ෂකවරුන්ගේ රාජකාරිය වනුයේ ටිකට් පත්‍රයක් නොමැතිව ගමන් ගන්නා මගීන් පරීක්ෂා කිරීම වේ. එසේ වුවත් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ටිකට් පත්‍රයක් නොමැතිව ගමන් ගන්නා මගීන්ගෙන් අයකරනු ලබන දඩ මුදලින් සියයට 10 ක වටිනාකමක් ප්‍රදාන ලෙස එම කාර්ය ඉටු කරනු ලබන ටිකට් පරීක්ෂකවරුන් දුම්රිය ආරක්ෂක හා අනෙකුත් සේවාවන් වෙත දුම්රිය ස්ථාන මගින් ගෙවීම් කරනු ලබන අතර එම ගෙවීම් සඳහා කිසිදු ගණකාධිකාරීවරයෙකුගේ අනුමැතියක් නොතිබීමත්, එම ගෙවනු ලබන දීමනාව නිලධාරියාගේ වැටුපෙන් අයකරනු ලබන උපයන විට ගෙවීම් බදු ගණනයටද අදාල කර නොතිබුණි.

**2.10 පාඩු හා හානි**

ආයතන 25 කින් දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු රු. 260,017,513 ක හිඟ ආදායම 1980 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලය තුළදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ආයතන අතර දැනට වසා දමා ඇති ආයතනද, තිබූ බව නිරීක්ෂණය විය.

**2.11 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 160 | 97 | 63 | - |
| (ii) | තෘතියික මට්ටම | 349 | 146 | 203 | - |
| (iii) | ද්විතියික මට්ටම | 9,408 | 6,844 | 3,701 | 1,137 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13,458 | 7,538 | 5,929 | 09 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | | 2,674 | - | 2,674 |
| | **එකතුව** | **23,375** | **17,299** | **9,896** | **3,820** |

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට ආදේශක පත්වීම් ලැබූ 50 කට වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහන අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අතර ඔවුන් මුදාහල දිනයේ සිට 2012 දෙසැම්බර් 31 දින වන තෙක් ගෙවා තිබූ වැටුප් හා අතිකාල දීමනාවල එකතුව රු. 1,418,383 ක් එම අමාත්‍යාංශයන් ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

## 3. ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 3.1 විගණන විෂය පථය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන,පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 20 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 3.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

#### (i) පිළිතුරු නොලත් විගණන විමසුම්

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 28 ක් සහ ඉකුත් වර්ෂවලදී යවන ලද විගණන විමසුම් 10 කට 2013 දෙසැම්බර් 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

#### (ii) තොරතුරු ඉදිරිපත් නොකිරීම

අංක 31,32,60,61,62,64 සහ 65 යන ඉලක්කම් අංක කාණ්ඩයන් යටතේ ලියාපදිංචි කර ඇති සියලුම වාහන පිළිබඳවද, G, H හා J ඉංග්‍රීසි අකුරු කාණ්ඩවල මෝටර් කාර් යටතේ ලියාපදිංචි කර ඇති සියලුම වාහන සම්බන්ධයෙන්ද තොරතුරු විගණන පරීක්ෂණ කටයුතු සඳහා ලබාදෙන මෙන් ඉල්ලා සිටියද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එකී තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

සමාලෝචිත වර්ෂයේදී විගණන පරීක්ෂණ කටයුතු සඳහා අවස්ථා හතකදී ඉල්ලා සිටින ලද වාහන ලිපිගොනු 701 ක් 2013 නොවැම්බර් 15 දින වන විටත් විගණනයට ලබා දී නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

--------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(i) වැය විෂයයක් යටතේ සලසා තිබුණු රු.290,000 ක් වූ සම්පූර්ණ පුනරාවර්ථන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, එසේ සළසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාර යම් නිශ්චිත කාර්යයන් සඳහා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාගත් විට, එම කාර්ය නිම වූ විගස පියවිය යුතු වුවත්, නිලධාරීන් අවස්ථා 06 කදී එකතුව රු. 297,600 ක අත්තිකාරම් සති 01 සිට මාස 08 දක්වා කාල පමාවකින් පසුව නිරවුල් කර තිබුණි. ඒ අනුව නිලධාරීන් කිහිපදෙනෙකු විසින් රජයේ මුදල් පෞද්ගලික පරිහරණයට යොදවාගෙන තිබුණි.

**(ii)** මුදල් රෙගුලාසි 372 ප්‍රකාරව දෙපාර්තමේන්තුවක අග්‍රිමය නැතහොත් අතුරු අග්‍රිමයක් පරීක්ෂා කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ අන්‍ය නිලධාරියා විසින් මාසයකට එක් වරක් නොඅඩුවන සේ පරීක්ෂණයක් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.2,671,755 ක් වූ තැන්පතු 99 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ii)** 2012 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.422,075,896 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.442,544,996 ක් විය. ඒ අනුව වෙනස හඳුනාගෙන සැසඳීම් කර නොතිබුණි.

**(iii)** වාහන පැවරුම් හා ලියාපදිංචි කිරීම් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තුවෙන් එක් එක් පළාත් සභාවට අයත් මුදල පසු මාසයේදී අදාල පළාත් සභාවට ප්‍රේෂණය කළයුතු නමුත් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තළ එකතුව රු. 40,099,186 ක් උතුරු නැගෙනහිර පළාත් සභාවට අයත් ආදායම එකී පළාත් සභාවලට යැවීමට සහ 2009 පෙබරවාරි සිට 2012 දෙසැම්බර් දක්වා කාලය තුළ රු.53,288,173 ක වාහන ලියාපදිංචි කිරීමේදී හා පැවරීමේදී අයකර ගත් මුද්දර ගාස්තු ආදායම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමටද කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**(ඊ) ආදායම් ගිණුම**

**සුඛෝපභෝගී මෝටර් වාහන බදු - ආදායම් සංකේතය 10-03-01-00**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** දෙපාර්තමේන්තුව විධිමත් ලෙස ආදායම් ලේඛණ පවත්වා නොතිබූ බැවින් ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද අයවිය යුතු හිඟ ආදායම් විගණනයේදී තක්සේරු කළ නොහැකි විය.

**(ii)** මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

**(iii)** 2001 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය පරිදි ආදායම් තත්ත්වයන් ඇස්තමේන්තු කිරීම් හා කළින් කළට ආදායම් තත්ත්වයන් අඛණ්ඩව සමාලෝචනය හා අධීක්ෂණය විධිමත් පරිදි කිරීම ආදායම් ගණන් දීමේ නිලධාරීන් විසින් ඉටු කර නොතිබුණි.

**(iv)** 2004 වර්ෂය තුළ සුඛෝපභෝගී බද්දට යටත් වාහන සම්බන්ධයෙන් කළ නියැදි පරික්ෂාවේදී රු.84,827,250 ක් වූ බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. ඒ අනුව මෙම සුඛෝපභෝගී බදු ආරම්භ කරන ලද 1995 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වසර 17 ක කාලය තුළ මෙකී බද්ද යටත් වාහන හිමියන් විසින් ගෙවීම් පැහැර හැර තිබුණු බදු මුදල ආසන්න වශයෙන් රු.1,442,063,250 ක් පමණ වී තිබුණි.

**(v)** **අඩුවෙන් අයකළ ආදායම්**

**-------------------------------**

සුඛෝපභෝගී බදු මුදල් අයකළ යුතු වාහනයක් සඳහා අය කළ යුතු බදු මුදල වන රු.150,000 ක මුදල අයකර නොතිබුණි.

**(vi)** **වැඩියෙන් අය කිරීම්**

**-------------------------**

2011 සැප්තැම්බර් 09 දිනැති අංක 1722/27 දරන ගැසට් පත්‍රයේ සඳහන් උප වගන්තියට අනුව මෝටර් වාහනයක් ආනයනය කළ දින සිට දින 30 ට වැඩි එහෙත් වර්ෂ 1 කට අඩු කාලයක් තුළ ලියාපදිංචි කිරීමේදී අය කරනු ලබන දඩ මුදල අළුත් අත් ට්‍රැක්ටර් සඳහා රු.1,500 ක් සහ පාවිච්චි කළ අත් ට්‍රැක්ටර් සඳහා රු.1,750 ක් ලෙස වෙන් වෙන් වශයෙන් දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් ආනයනය කරනු ලබන සියලුම අත් ට්‍රැක්ටර් සඳහා ලියාපදිංචි තත්ත්වය නොසළකා රු. 1,750 ක දඩ මුදලක් අය කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

**II. හිඟ ආදායම්**

-----------------

සුබෝපභෝගී බදු මුදල් අයකිරීම සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂණවලට අනුව රුපියල් මිලියන 1,442 කට ආසන්න හිඟ ආදායමක් පැවති අතර, එම මුදල නියමිත වේලාවට අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු නොකිරීම මත සියයට 10 ක පොලී අනුපාතිකයක් අනුව ගණනය කලද රජයට වාර්ෂිකව රුපියල් මිලියන 144 කට ආසන්න පාඩුවක් සිදුවන බවක නිරීක්ෂණය වේ.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

පහත සඳහන් පරිදි ආපදා, උත්සව අත්තිකාරම් සහ අනෙකුත් ණය වර්ගවල ණය මුදල් නිසි ලෙස ආපසු අයකර ගැනීමට කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

**(i)** 1993 වර්ෂයේ සිට සේවය හැරගිය හා සේවයෙන් පහකළ නිලධාරීන් අට දෙනෙකුගෙන් එකතුව රු.185,388 ක ණය ශේෂද 1998 වර්ෂයේ සිට වැඩ තහනමට ලක්ව සිටි නිලධාරීන් 17 දෙනෙකුගෙන් එකතුව රු.1,170,753 ක ණය ශේෂද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** පෙර වර්ෂවල සිට පැවත එන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය අතර රු.4,766 ක වෙනසක් පෙන්නුම් කළද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය සසඳා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(iii)** විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ රු.986,345 ක් වුවද, එම පැරණි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(iv)** කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව සහ පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය අතර, 2011 වර්ෂයේදී රු.1,229,995 ක් පැවති නොසැසඳුනු ශේෂය 2012 වර්ෂයේදී රු.2,107,052 දක්වා වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂ සසඳා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(v)** 2011 අගෝස්තු 29 දිනැති අංක SA/AS/MS/06/28 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර පැරණි ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 3.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂවරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 වන දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 402 (1) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් තුළ විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, ඉකුත් වර්ෂයට අදාල කාර්යයසාධන වාර්තාව 2013 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම ඉතාමත් දුර්වලත මට්ටමක පැවතුණි. 2012 වර්ෂයේදී කමිටුවේ රැස්වීම් වාර 3 ක් පමණක් පවත්වා තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත 01 ක්ද, ඌණතා 19 ක් ද හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සඳහා වර්ග නවයකින් යුත් භාණ්ඩ 11 ක් රැගෙන ගොස් තිබුණද, එකී භාණ්ඩ ප්‍රමාණය දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදුන් බවට තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ලියාපදිංචි සහතික මුද්‍රණය කිරීමේ යන්ත්‍ර 20 ක් එකක් රු.583,477 බැගින් 2010 ඔක්තෝබර් 12 දින රු.11,669,540 කට මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගන්නා ලද යන්ත්‍ර 20 න් ප්‍රධාන කාර්යාලය වෙත යන්ත්‍ර 07 ලබා දී තිබුණු අතර, ඒ පිළිබඳව 2012 දෙසැම්බර් 20 දින විගණනය විසින් කරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී යන්ත්‍ර 04 ක්ම මීයන් විසින් කරන ලද හානි හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබුණි.එසේම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛණ අංශයේ මුද්‍රණ කටයුතු සඳහා සාමාන්‍ය මුද්‍රණ යන්ත්‍රයක් ලබාදීම වෙනුවට රු.583,477 ක් වැයකර ලියාපදිංචි සහතික මුද්‍රණය කිරීමේ යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කර තිබුණි.

## 3.6 අනුකූල නොවීම

### (අ) නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර එහි වාර්තා විගණකාධිපති වෙත 2013 දෙසැම්බර් 31 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල් ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාරයේ පවත්නා නිලධාරීන් 612 අධිකාරිය යටතේ ඇප තැබිය යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |
| **(ii) භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පරිගණක යන්ත්‍ර හා උපාංග වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

**(i)** ජාතිය ගොඩනැගීමේ බද්ද නිෂ්පාදකයා හෝ සේවා සපයන්නා විසින් දරා ගැනීමේ ප්‍රතිපාදනයන් 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතට අනුව පැවතියද, රියදුරු බලපත්‍ර ලබාගැනීම වෙනුවෙන් එකී බදු මුදලද සමඟ සැපයුම්කාර ආයතනයට ගෙවීම් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් 2009 මැයි මාසයේ සිට 2012 දෙසැම්බර් මාසය දක්වා රියදුරු බලපත්‍ර සැපයීම වෙනුවෙන් සැපයුම්කාර ආයතනය වෙත රු.44,538,368 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

**(ii)** 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ II පරිච්ඡේදයේ 10 වගන්තියට අනුව හා ඊට අදාල සංශෝධනයන්ට අනුව යම් ආයතනයක සේවා හා සැපයුම් මත කාර්තුවට ලැබෙන සැපයුම් හා සේවා වටිනාකම රු.650,000 ක් හෝ වර්ෂයකට රු.ලක්ෂ 25 ක් හෝ ඊට වැඩි වන්නේ නම් එකතු කළ අගය මත බද්දට අනිවාර්යයෙන් ලියාපදිංචි වියයුතු වුවත්, දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවීම නිසා අතිවිශාල ආදායමක් රජයට අහිමි වී තිබුණි. එකම දෙපාර්තමේන්තුවේ 2011 සහ 2012 වර්ෂවල සේවා සැපයුම පිළිවෙලින් රු.6,325,878,729 ක් සහ රු.6,577,711,148 ක් වුවද, එකතු අගය මත බද්දට ලියාපදිංචි නොවීම හේතුවෙන් 2011 සහ 2012 වර්ෂයේදී පමණක් රජයට රු.1,548,430,785 ක ආදායමක් අහිමි වී තිබුණි.

**(iii)** ඉහත (i) සහ (ii) ඡේද යටතේ දක්වා ඇති බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම මඟින් රජයට වන පාඩුව පිළිබඳව ඉකුත් වර්ෂයේදීද මාගේ වාර්තාව මඟින් පෙන්වා දී තිබුණද, එම තත්ත්වය නිවැරදි කර ගැනීමට දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.7 කාර්ය සාධනය

### 3.7.1 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ කරුණු කිහිපයක් පහත දැක්වේ.

**(අ) වාහනවල අයිතිය පැවරුම් සිදු කිරීම ප්‍රමාණවත් පරිදි ඉටු නොකිරීම**

**(i)** වාහනවල අයිතිය වෙනස්වීමේදී මෝටර් රථ පනතේ 12(3)(අ) වගන්තියේ විධිවිධාන අනුව වාහනවල ලියාපදිංචි අයිතිකරුවන් විසින් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ii)** පනතේ 12(3)(ආ) වගන්තියට අනුව නව අයිතිකරු වශයෙන් ලියාපදිංචිවීම සඳහා සන්තකය වෙනස්වීමෙන් පසු දින දාහතරක් ඇතුළත ඉල්ලුම් කිරීම සිදු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකළ අවස්ථා සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) සුඛෝපභෝගී බදු අයකර ගැනීමේදී ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** හිඟ රාජ්‍ය ආදායම පිළිබඳව වාර්තා නොකිරීම සහ හිඟ ආදායම් එකතු කර ගැනීමේ දුර්වලතා පැවතුණි.

**(ii)** බදු මුදල් අය කිරීම හා ලැබිය යුතු බදු මුදල් පිළිබඳව ක්‍රමවත්ව වාර්තා තබාගෙන නොතිබුණි.

**(iii)** ආදායම් පාලන ගිණුම් පවත්වා නොතිබුණි.

**(iv)** පරිගණක පද්ධතියේ සහ එහි ක්‍රියාකාරීත්වයේ පැවති අඩුපාඩු නිවැරදි කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**(v)** බදු අයකරගැනීමේ කටයුත්ත නිසි පරිදි ඉටු නොකරන ලද රක්ෂණ ආයතන සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(vi)** බදු ගෙවීම් පැහැර හරිනු ලබන වාහන හිමියන් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

**(vii)** වාහන ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේ වාහන හිමියන්ගෙන් සුඛෝපභෝගී බදු මුදල අය කළ යුතු වුවත්, එලෙස අවස්ථා 54 කදී අයකර නොතිබුණි.ආයතන සංග්‍රහය ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.වාහන හිමියන් 34 කගෙන් එකී බදු මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**(viii)** සුඛෝපභෝගී බදු කුවිතාන්සි පොත් එක් එක් රක්ෂණ ආයතනයට නිකුත් කිරීම සහ ආපසු ලැබීම් පිළිබඳව විධිමත්ව හඳුනාගත හැකි ආකාරයට උපපත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**(ඇ) පරිගණ පද්ධතිය තුළ රහස් වදන් (Pass word) භාවිතා කිරීම පිළිබඳව පවත්නා අවිධිමත්භාවය**

---

**(i)** එක් නිලධාරියකු නව ලියාපදිංචි අංශයකින් පැවරුම් ශාඛාවකට හෝ පැවරුම් අංශයකින් නව ලියාපදිංචි අංශයකට හෝ වෙනත් අංශයකට හෝ මාරු කරන විට පෙර අංශයේ භාවිතා කළ රහස් වදන් අඩංගු කර නොමැති නිලධාරීන් 20 දෙනෙකු සිටින බව අනාවරණය විය.

**(ii)** දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගන්නා විට හෝ දෙපාර්තමේන්තුවෙන් වෙනත් දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරු වන විට හෝ නිලධාරියකු සේවයෙන් ඉවත් වූ විට හෝ මිය ගිය විට එම නිලධාරියා භාවිතා කළ රහස් වදන් අවලංගු කර නොතිබූ නිලධාරීන් පස් දෙනෙකු සිටින බව අනාවරණය විය.

**(iii)** 2011 ජනවාරි 10 දිනැති අංක DMT/COM/113/දෙපා දරන නියෝග චක්‍රලේඛය හා 2012 අගෝස්තු 06 දිනැති අංක DMT/H/E/06/01 දරන අභ්‍යන්තර චක්‍රලේඛය අනුව වාහන අංක අසාධු ලේඛනගත කිරීම අභ්‍යන්තර විගණන අංශය විසින් පමණක් සිදු කළ යුතු අතර, අසාධු ලේඛනයෙන් ඉවත් කිරීම අදාල අංශවල සහකාර කොමසාරිස්වරු විසින් සිදු කළ යුතු වුවත්, වෙනත් භාවිත නම් (User Name) අයත් නිලධාරීන්ට තම රහස් වදන් මඟින් වාහන අසාධු ලේඛණගත කිරීමට පවතින හැකියාව නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ඇ)** **වාහන නව ලියාපදිංචි කිරීම**

-----------------------------------

වාහන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි පහත සඳහන් කාර්යයන් ඉටු කර නොතිබුණි.

**(i)** යතුරු පැදි ලියාපදිංචි කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවලට ලබා දී තිබුණද, එකී කාර්යාලවලට දිනකට ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන යතුරු පැදි සංඛ්‍යාව 01 ත් 05 ත් අතර ඉතා අඩු ප්‍රමාණයක් වී තිබුණි. දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලය සියලුම දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධතාවයක් නොතිබීමත්, දිස්ත්‍රික් කාර්යාල සඳහා ලබා දී ඇති වාහන ලියාපදිංචි අංකයන් පැරණි ඒවා වීමත් මෙසේ දිස්ත්‍රික් කාර්යාලවල ලියාපදිංචියට යොමුවන වාහන සංඛ්‍යාව අඩුවීමට හේතු වී තිබුණි. ඒ අනුව මෙම කාර්යය විමධ්‍යගත කිරීමේ පරමාර්ථයද ඉටු වී නොතිබුණි.

**(ii)** ආනයනික පාවිච්චි කරන ලද අත්ට්‍රැක්ටර් දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කිරීමේදී මෝටර් රථ පරීක්ෂකවරයෙකු විසින් එකී වාහනය භෞතික පරීක්ෂාවට ලක්කර පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමත් සිදුකර නොතිබුණි.

**(iii)** දෙපාර්තමේන්තුව තුළ සිදුවන වංචනික කටයුතු පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත දිගින් දිගටම විගණන විමසුම් මගින් පෙන්වා දී තිබුණද, එම වංචනික කටයුතු සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණ සිදු කර, එකී වංචනික කටයුතු සඳහා මැදිහත්ව ක්‍රියා කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම සහ එම වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම ඇතුළු වාහන හිමිකරුවන් සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ විධිවිධාන ප්‍රකාරව පියවරවල් ප්‍රමාණවත් පරිදි ගෙන නොතිබුණි.

**(ඉ) මෝටර් වාහන පනතේ 18 වන වගන්තියේ සඳහන් විධිවිධාන යටතේ වන කාර්යභාරයන්**

මෝටර් වාහන පනතේ 08 සහ 18 වගන්තිවල දක්වා තිබුණු විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු කාර්යභාරය ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

**(i)** අනතුරකට පත් වූ වෙනත් ලෙසකින් සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලද වාහන සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** මෝටර් වාහන අවලංගු කළ වාහන පිළිබඳව ලේඛණයක් පවත්වා නොතිබුණි.

**(iii)** අඛණ්ඩව අවුරුදු දෙකකට වඩා වැඩි කාලයකට අදාලව ආදායම් බලපත්‍ර ලබානොගත් වාහන සම්බන්ධයෙන් මෝටර් වාහන පනතට අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(iv)** සුනාමි, ත්‍රස්තවාදී ව්‍යවසනයන් ඇතුළු ස්වභාවික හා ස්වභාවික නොවන කරුණු හේතුවෙන් බොහෝ වාහන විනාශ වී තිබුණත්, එකී වාහන සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුකර නොතිබුණි.

**(v)** දිවයින තුළ සත්‍ය වශයෙන්ම ධාවනය කරනු ලබන වාහන පිළිබඳව සංඛ්‍යාත්මක තොරතුරු හඳුනාගත හැකි පරිදි ලේඛණ පවත්වා නොතිබුණි.

**(ඊ) වාහන ලිපිගොනු ආරක්ෂා කිරීම**

දෙපාර්තමේන්තුවේ දෛනිකව ලියාපදිංචි කරනු ලබන වාහනවල මුල් ලිපිගොනු ආරක්ෂා කර තබා ගැනීම අත්‍යවශ්‍ය වූ කාර්යභාරයක් වුවද, වාහනවල මුල් ලිපිගොනු විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තු භාරයේ නොපැවතීම හෝ අතුරුදන් වී තිබුණු අතර එකී අත්‍යාවශ්‍ය වූ කාර්යභාරය දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි.

**(උ) ත්‍යාග අරමුදල මඟින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන්**

ත්‍යාග අරමුදල මඟින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන්හි පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

**(i)** මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ නියමිත අනුමැතියක් ලබාගැනීමකින් තොරව මෝටර් වාහන සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අළුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකිරණය කිරීම හෝ නිර්මාණය වෙනස් කිරීමේ කටයුතු ඇතුළු මෝටර් වාහන සම්බන්ධයෙන් ඇතිවන විවිධ සාවද්‍ය ක්‍රියාකාරකම් අවම කර ගැනීමට සහ එවැනි ක්‍රියාකාරකම්වල නියැලෙස පුද්ගලයින්ව අනාවරණය කිරීම හා ඔවුනට විරුද්ධව නෛතිකමය ක්‍රියාමාර්ග ගැනීම මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ වුවද, එවැනි කිසිඳු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුව විසින් ඉටු කර නොතිබුණි.

**(ii)** මෝටර් වාහන සම්බන්ධයෙන් විවිධ සාවද්‍ය ක්‍රියාවන් නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳව තොරතුරු සපයන තැනැත්තන්ව බිහි කිරීමත්, එවැනි තොරතුරු සැපයීමට ඔවුන්ව ධෛර්යමත් කිරීමත් සහ එවැනි සාවද්‍ය ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිලධාරීන්ව ධෛර්යමත් කිරීමත් ත්‍යාග අරමුදල පිහිටුවීම මගින් බලාපොරොත්තු වූ කටයුත්තක් වුවද, එවැනි තොරතුරු සපයන්නන් සහ නිලධාරීන් ධෛර්යමත් වන ආකාරයේ කිසිදු ක්‍රියාකාරකමක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබුණි.

### 3.7.2 සැලසුම් කිරීම

------------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

----------------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණි.

**(අ)** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් යටතේ වාහන ගම්මාන සංකල්පයට රු.මිලියන 0.5 ක ප්‍රතිපාදන සළසා තිබුණත් සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

**(ආ)** 2012 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවූ දැයට කිරුළ වැඩසටහන සඳහා රු.මිලියන 7 ක ප්‍රතිපාදනය සළසා තිබුණු අතර ඉන් රු. 2,768,082 ක් උපයෝජනය කර තිබුණි.

**(ඇ)** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දිස්ත්‍රික් කාර්යාල විමධ්‍යගත කිරීම සඳහා රු.මිලියන 100 ක් ඇස්තමේන්තු කර තිබුණද, එකී කාර්යභාරය සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි.

### 3.7.3 වාහන ලියාපදිංචි කිරීම, පැවරුම් කිරීම ඇතුළු කාර්යයන් ඉටු කිරීම සඳහා වූ පරිගණක පද්ධතිය

වාහන ලියාපදිංචි කිරීම, පැවරුම් කිරීම ඇතුළු කාර්යයන් ඉටු කිරීම සඳහා භාවිතා කර තිබුණු පරිගණක පද්ධතියේ පහත සඳහන් අවිධිමත්භාවයන් නිරීක්ෂණය විය.

**(අ)** රේගු පරිගණක පද්ධතිය ජාලය හරහා දෙපාර්තමේන්තුව වෙත ලැබෙන වාහනවල තොරතුරු සෘජු ලෙසම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට හැකියාව ඇතිවන ලෙස වාහන ලියාපදිංචි සඳහා වැදගත් සියලුම තොරතුරු ජාල සම්බන්ධතාවයක් මඟින් සෘජුවම හා වෙනස් කළ නොහැකි ලෙස ලබාගත හැකි වන පරිදි පරිගණක පද්ධතිය සකස් කර නොතිබුණි.

**(ආ)** ලියාපදිංචිය සිදු කරන ලද වාහනවල යම් තොරතුරක් වෙනස් කිරීමේදී එය විධිමත්ව හා විනිවිදභාවයකින් යුතුව ඉටුවිය යුතු වන ආකාරයට පරිගණක පද්ධති වැඩසටහන් හා ක්‍රම පද්ධතිය සකස් කර නොතිබුණි.

**(ඇ)** අනවසර ප්‍රවේශයන් සහ අනවසර සංශෝධනයන් කිරීමට නොහැකි වන ලෙසත්, යෙදවුම් ලේඛන නොමැතිව දත්ත සෘජුවම පරිගණකයට ඇතුල් කිරීමට නොහැකි වන ලෙසත්, පළාත් කාර්යාලවල පද්ධතියට ඇතුළත් වී දත්ත අනවසර ලෙස වෙනස් කිරීම හා දත්ත අලුතින් ඇතුළත් කිරීමට නොහැකි වන ලෙස ප්‍රමාණවත් වූ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**(ඈ)** අනුමත කාර්යයන් සඳහා පමණක් පරිගණක පද්ධතිය භාවිතා කරන බව, අනුමත පුද්ගලයන්ට පමණක් පද්ධතියට ප්‍රවේශ විය හැකි බව, අනුමත වැඩසටහන් පමණක් භාවිතා කරන බව, සකස් කිරීමේදී තොරතුරු හඳුනා ගන්නා බව සහ නිවැරදි කරන බව පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම සඳහා ප්‍රමාණවත් පාලනයක් ස්ථාපිත කර නොතිබුණි.

**(ඉ)** දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරිගණක දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සහ පරිගණක වැඩසටහන් පිළිබඳව අත්පොත් ඇතුළු පරිගණක පද්ධතියක ඇති කළ යුතු පොදු පාලන (General Control) සහ භාවිත පාලන (Application Control) ක්‍රමවේදයන් ප්‍රමාණවත් ලෙස ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) එක් එක් ආනයනික වාහනයේ නිෂ්පාදන වර්ෂය, නිෂ්පාදිත රට සහ සිලින්ඩර ධාරිතාවය ඇතුළු වාහනය ලියාපදිංචිය සඳහා ඉතාමක් වැදගත් වූ සමහර තොරතුරු රේගු පරිගණක ජාලය හරහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලයට සම්බන්ධ කර නොතිබුණි. මෙම හේතුව මත වාහන නව ලියාපදිංචි අංශයේ වගකිව යුතු නිලධාරීන් හට වාහන නිෂ්පාදන වර්ෂය ඇතුළු තොරතුරු වෙනස් කර ලියාපදිංචි කිරීමට හැකියාව ලැබී තිබුණි. එසේම මෙවැනි වෙනස් කිරීම් කර බරපතල අක්‍රමිකතාවයන් සිදු කරනු ලැබූ අවස්ථා 200 කට වැඩි ප්‍රමාණයක් විගණන නියැදි පරීක්ෂණ මගින් අනාවරණය කරගෙන තිබුණි.

(උ) යතුරුපැදි නව ලියාපදිංචියට අදාලව පරිගණක පද්ධතිය පරීක්ෂා කිරීමේදී ආනයනික යතුරු පැදි අදාල චෙසි අංකය, එන්ජින් අංකය ඇතුළු එක් එක් යතුරුපැදිවල තොරතුරු රේගු පරිගණක ජාලය හරහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත සම්බන්ධ කර තිබුණද, යතුරු පැදි නව ලියාපදිංචි අංශයේ වගකිව යුතු නිලධාරීන් හට රේගු බදු නොගෙවා ආනයනය කරන ලද හෝ නිත්‍යානුකූල නොවන ලෙස සකසන ලද යතුරු පැදි ඉතා පහසුවෙන් ලියාපදිංචි කිරීමේ හැකියාව ලැබී තිබුණි.

## 3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ එකතුව රු.1,225,656 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මෝටර් රථ පනතේ 203 අධිකාරය හා ඊට අදාල සංශෝධනයන්ට අනුව මෝටර් වාහනයක් ආනයනය කරන ලද දින සිට දින 30 ක් හෝ ඊට වැඩි කාලයක් ගතවීමෙන් පසු ලියාපදිංචිය සිදු කරන ලද අවස්ථාවකදී එම මෝටර් රථය ලියාපදිංචිය සඳහා ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතු වුවත් යතුරු පැදි ලියාපදිංචි කිරීමේදී, දෙපාර්තමේන්තුව විසින් දිගින් දිගටම ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. එමනිසා රජයට විශාල ආදායමක් අහිමි

වන බව විගණන විමසුම් මගින් පෙන්වා දී තිබුණත්, දෙපාර්තමේන්තුව එසේ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** මුලින්ම ආරම්භ වන ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ අකුරුවලට පසුව එනු ලබන ඉලක්කම් 04 හි එකතුව 13 වන ඉලක්කම් හැර අනෙකුත් සියලුම අංකයන් යටතේ වාහන ලියාපදිංචිය සිදුකළ යුතු වුවද, අංක KI -5001 සිට අංක KI- 9999 දක්වා සහ අංක KV – 7001 සිට අංක KW -0658 දක්වා වාහන ලියාපදිංචිය සිදු කිරීමේදී එකී අංක කාණ්ඩයන් අතරට වැටෙන වාහන හඳුනාගැනීමේ අංකයන් 40 ක් යටතේම වාහන ලියාපදිංචිය සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව විගණන නියැදියෙන් බැහැරව අති විශාල ප්‍රමාණයක් මෙලෙස වාහන හඳුනාගැනීමේ අංකයන් යටතේ වාහන ලියාපදිංචිය සිදුකර නොතිබුණි. මෙලෙස වාහන අංකයන් මගහැර වාහන ලියාපදිංචි කිරීම මගින් නීති විරෝධි ලෙස ආනයනය කරන ලද වාහන වංචනික ලෙස ලියාපදිංචි කිරීමේ හැකියාව සහ එකී මගහැර ඇති අංකයන් යොදාගෙන ව්‍යාජ වාහන ලියාපදිංචි සහතිකයන් මත වාහන ධාවනය කිරීමේ ඉතාමත් ඉහළ අවදානම් තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

**(ඇ)** ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරන අංශය විසින් විකුණන වාහනවල චෙසි අංකය අසාධු ලේඛනගත කර එම චෙසි අංකයට CMT අංකයක් ලබා දී Registration Status Bought from Auction ලෙස ඇතුළත් කළ යුතු වුවත්, වාහන 20 කට අදාලව එලෙස කටයුතු කර නොතිබුණි.

**(ඈ)** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ පාවිච්චි කරන ලද වාහන තුනක් 2010 මැයි 22 දින රේගු දෙපාර්තමේන්තුවේ මධ්‍යම විකුණුම් අංශය විසින් වෙන්දේසියේ විකුණා තිබුණි. කෙසේ වුවද, මධ්‍යම විකුණුම් අංශය විසින් විකුණන ලද වාහන තුනේ වාහන හඳුනා ගැනීමේ අංකයන් යටතේම වෙනත් වාහන තුනක්ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි.

**(ඉ)** මෝටර් වාහනයක සන්තකය වෙනස් කිරීමේදී ලියාපදිංචි සහතිකයෙහි මුද්‍රිත දිනය පරිගණක පද්ධතියට අනුව ස්වයංක්‍රීයව මුද්‍රණය වුවද, අංක 302 ඉලක්කම් අංක කාණ්ඩයට අයත් වාහන 2111 කට අදාල ලියාපදිංචි සහතික පරීක්ෂාවේදී මුද්‍රිත දිනයෙන් පසුවද සන්තකය වෙනස් වූ අවස්ථා 84 ක් නිරීක්ෂණය විය.

**(ඊ)** වාහනයේ සිලින්ඩර ධාරිතාව හා නිෂ්පාදන වර්ෂය ඇතුළු සමහර වැදගත් තොරතුරු වාහනයේ ලියාපදිංචි සහතිකයේ ඇතුළත් කර නොතිබූ අවස්ථා දෙකක් නිරීක්ෂණය විය.

**(උ)** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද දිනය ලෙස වාහන ලියාපදිංචි සහතිකයේ සටහන් දිනයට පෙර දිනයකදී වාහනයේ අයිතිය මාරු වී තිබූ අවස්ථා දෙකක් නිරීක්ෂණය විය.

**(ඌ)** එකම දිනයකදී එකම වාහනය පැවරුම් තුනකට වඩා සිදු වූ අවස්ථා පැවතුණි.

**(එ)** විගණන පරීක්ෂණයන්ට අනුව අසාදු ලේඛනගත කරන ලද වාහන 61 කින් වාහන 08 ක් නැවත අසාධු ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. මෙම ඉවත් කිරීමට පදනම් වූ හේතූන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඒ)** දෙපාර්තමේන්තුවේ පරිගණක තොරතුරු පද්ධතියට අනුව වේග සටහන්කරයේ හා දිනයන් යටතේ ආනයනය කර තිබූ බවට සඳහන් සමහර වාහන ආනයනය කළ බවට සඳහන් රේගු සටහන්කරයේ දිනයට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සිදුකර තිබූ අවස්ථා 82 ක් නිරීක්ෂණය විය.

## 3.10 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

ලියාපදිංචි සහතික මුද්‍රණය කිරීමේ යන්ත්‍ර 20 ක් රු.11,669,540 ක් වැයකර මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වන කාර්ය සාධන ඇපකරය හෙවත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 හෙවත් රු. 583,477 ක් විය යුතු වුවත්, ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන බැඳුම්කරයේ වටිනාකම රු.100,000 ක් වී තිබුණි.එසේම ප්‍රසම්පාදන කොන්දේසිවලට අනුව මෙම භාණ්ඩ දින 30 ක් ඇතුළත සැපයිය යුතු වුවත්, එකී මුද්‍රණ යන්ත්‍ර සැපයීම සඳහා මාස දෙකකට වැඩි කාලයක් ගත වී තිබුණි.

**(ආ) අධිකාරි බලය නොමැති වූ අවස්ථා**

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

**(i)** 2011 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශන කටයුතු සඳහා සහභාගීවීම වෙනුවෙන් නිලධාරීන්ට අවිධිමත් ලෙස ගෙවන ලද රු.78,360 ක සංයුක්ත දීමනාව ගෙවීම් අනුමත කළ, සහතික කළ වගකිව යුතු නිලධාරීන්ගෙන් ආපසු අයකර ගැනීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ii)** 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 (ඇ) උපඡේදය පරිදි සියලුම දීමනා හා දිරිකාරක ගෙවීම් පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විමසා උපදෙස් නිකුත් කිරීම කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව 2012 වර්ෂයේදී රු.128,146,204 ක මුදලක් දිරිදීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.

## 3.11 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ)** එකම රේගු සටහන්කරයක් මගින්, පාවිච්චි කරන ලද යතුරු පැදි හා අත් ට්‍රැක්ටර් තොග වශයෙන් ආනයනය කිරීමේදී රේගු සටහන්කරයේ ඇතුළත් සියලුම යතුරු පැදි සහ අත් ට්‍රැක්ටර් පිළිබඳව චෙසි අංකය, එන්ජින් අංකය ඇතුළු විස්තර ඇතුළත් ලියවිල්ලේ (Packing List) තොරතුරු වෙනස් කරමින් රේගු බදු නොගෙවා මෙරටට ගෙන්වන ලද යතුරු පැදිවල සහ අත් ට්‍රැක්ටර්වල චෙසි අංකය, එන්ජින් අංකය ඇතුළු තොරතුරු එම ලියකියවිලිවලට ඇතුලත් කරමින් ව්‍යාජ ලෙස සකස් කරන ඇසුරුම් ලේඛනය (Packing List) ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේද සහයෝගය ලබා ගනිමින් යතුරු පැදි හා අත් ට්‍රැක්ටර් ලියාපදිංචි කර තිබුණි.

**(ආ)** වාහන ආනයන බලපත්‍ර මත ගෙන්වන වාහනවලට අමතරව සාමාන්‍ය නීති රීති යටතේ ආනයනය කර තිබූ වාහන, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේදී නියමිත නිෂ්පාදන වර්ෂය, වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා පරාසයක් තුළ සාවද්‍ය ලෙස ඉදිරි වර්ෂයන් ඇතුළත් කරමින් ලියාපදිංචිය සිදු කරමින් බරපතල අක්‍රමිකතාවයන් සිදු කළ අවස්ථා 29 ක් අනාවරණය විය.

**(ඇ)** 2013 වර්ෂයේ මැයි සහ ජුනි මාසවලදී ලියාපදිංචිය සිදු කර තිබුණු KV-7001 සිට KW-0658 දක්වා වාහන හඳුනාගැනීම් අංකය යටතේ NZT හා NZE වෙසි වර්ගයන් යටතේ ලියාපදිංචිය සිදුකර තිබූ මෝටර් කාර් සම්බන්ධයෙන් කරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේදී, යතුරු පැදි සහ වාහන අමතර කොටස් ආනයනය කරන ලද රේගු සටහන්කර පහක අංකයන් උපයෝග කර ගනිමින් නීති විරෝධී ලෙස රේගු බදු නොගෙවා ආනයනය කරන ලද ටොයෝටා ඇලියන්, ටොයෝටා ප්‍රීමියෝ සහ ටොයෝටා කොරොල්ලා ඇක්සියෝ වර්ගවල වාහන 05 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වංචනික ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.

**(ඇ)** ආනයනය කරන ලද වෙනත් මෝටර් රථ වාහනවල රේගු සටහන්කර අංකයන් ව්‍යාජ ලෙස භාවිතා කරමින් නීති විරෝධි ලෙස රේගු බදු නොගෙවා ආනයනය කරන ලද හෝ සකසන ලද ටොයෝටා, ලැන්ඩ් ක්‍රූස්, ප්‍රාඩෝ වර්ගයේ ජීප් රථ දෙකක් මිට්ෂුබිසි මොන්ටෙරෝ වර්ගයේ ජීප් රථ දෙකක් සහ මර්සිඩීස් බෙන්ස් රථ හතරක් ඇතුළු වාහන 18 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වංචනික ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.

**(ඉ)** G, H හා J යන ඉංග්‍රීසි අක්ෂරවලින් පටන් ගන්නා පැරණි අංක කාණ්ඩයන් යටතේ ලියාපදිංචිය සිදුකර තිබුණු මෝටර් සයිකල්වල පරිගණක දත්ත සූක්ෂම ලෙස වෙනස් කිරීමෙන් ඒ වෙනුවට නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද නවීනතම සුඛෝපභෝගී වාහන 03 ක විස්තර පරිගණකයට ඇතුළත් කර වංචනිකව එම වාහන 03 ලියාපදිංචි කර තිබුණි.

**(ඊ)** G, H හා J යන ඉංග්‍රීසි අක්ෂරවලින් පටන් ගන්නා පැරණි අංක කාණ්ඩයන් යටතේ ලියාපදිංචිය සිදුකර තිබුණු වෙනත් අඩු වටිනාකම් සහිත වාහනවල පරිගණක දත්ත සූක්ෂම ලෙස වෙනස් කිරීමෙන් නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද නවීනතම සුඛෝපභෝගී වාහනවල විස්තර පරිගණකයට ඇතුළත් කර වංචනිකව වාහන ලියාපදිංචි කරන ලද අවස්ථාවක් නිරීක්ෂණය විය.

**(උ)** G, H හා J යන ඉංග්‍රීසි අකුරු කාණ්ඩයේ මුල් අකුර ලෙස ඇති අංක කාණ්ඩයන් යටතේ, මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී විවිධ හේතු නිසා ඇතැම් අංක යටතේ වාහන ලියාපදිංචි කිරීම මගහැරී තිබූ අතර, එසේ මගහැරී තිබූ අංක යොදාගෙන මෙරටට රේගු බදු ගෙවීමෙන් තොරව නීති විරෝධි ලෙස ගෙන්වා තිබුණු වාහන 29 ක් වංචනික ලෙස ලියාපදිංචි කර තිබුණි.

**(ඌ)** ඉලක්කම් අංක කාණ්ඩ යටතේ වාහනවලට හඳුනා ගැනීමේ අංක ලබාදීම වෙනුවට ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ වාහනවලට හඳුනා ගැනීමේ අංක ලබාදීම 2000 වර්ෂයේ ආරම්භ කර තිබුණි. එම ආරම්භ කරනු ලබන අවස්ථාවේදී පෙට්‍රල් මෝටර් කාර් සඳහා 302 අකුරු කාණ්ඩ යටතේ සියලුම අංකයන් යටතේ වාහන ලියාපදිංචි කර නොතිබුණි.ඒ අනුව 302 ඉලක්කම් අංක කාණ්ඩ යටතේ ඉතිරිව තිබූ අංකයන් යොදා ගනිමින් රේගු බදු නොගෙවා නීතිවිරෝධී ලෙස ආනයනය කරන ලද හෝ සකසන ලද වාහන වංචනික ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි. එවැනි සැක කටයුතු අවස්ථා 02 ක් නිරීක්ෂණය විය.

**(එ)** මුලින්ම ආරම්භ වන ඉංග්‍රීසි හෝ ඉලක්කම් අකුරු කාණ්ඩ යටතේ අකුරුවලට පසුව එනු ලබන ඉලක්කම් 04 හි එකතුව 13 වන ඉලක්කමක් යටතේ වාහන ලියාපදිංචි කිරීම සිදු නොකරන නමුදු, එකී ඉලක්කම් යටතේද සුඛෝපභෝගී වර්ගයේ මෝටර් කාර් රථ 06 ක් වංචනික ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.

**(ඒ)** 2012 දෙසැම්බර් 15 දින වන විට, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වාහනයක් 2009 සැප්තැම්බර් 19 දින වෙනත් පුද්ගලයෙකුගේ නමකට පවරා ඇති බවට පරිගණක පද්ධතියේ ඇති වාහන ලියාපදිංචි සහතිකය පරීක්ෂා කිරීමෙන් අනාවරණය විය. ඒ අනුව එකම වාහනය හඳුනාගැනීමේ අංකය යටතේ වාහන එකකට වැඩි සංඛ්‍යාවක් ධාවනයේ යෙදෙන බව නිරීක්ෂණය විය.

**(ඔ)** ලියාපදිංචි කරන ලද වාහනවල වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගැනීම සහ සුඛෝපභෝගී බදු මුදල් ගෙවීම ඇතුළු තොරතුරුවලට අනුව නීති විරෝධී ලෙස රේගු බදු නොගෙවා ආනයනය කරන ලද හෝ සකසන ලද මිට්ෂුබිසී මොන්ටොරෝ වර්ගයේ වාහන 02 ක් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඕ)** අනතුරට පත් වී හෝ වෙනත් ලෙසකින් ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල අංකයන් යොදා ගනිමින් රේගු බදු නොගෙවා නීති විරෝධී ලෙස ආනයනය කරන ලද හෝ සකසන ලද මිට්ෂුබිසී මොන්ටොරෝ වර්ගයේ ජීප් රථයක් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.

**(ක)** රේගු බදු නොගෙවා නිත්‍යානුකූල නොවන ලෙස ආනයනය කරන ලද (Hummer) හමර් වර්ගයේ මෝටර් කාර් රථයක් අවිධිමත් ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.එසේම එකී වාහනයේ ලිපිගොනුව අස්ථානගත වී තිබුණි.

**(ඛ)** රේගු දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධති ජාලය හරහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත සම්ප්‍රේෂණය කරනු ලබන වාහනවල චෙසි අංකය ඇතුළු තොරතුරු වෙනස් කරමින් අක්‍රමිකතාවයන් රාශියක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණි. එලෙස නිරීක්ෂණය වූ එක් අවස්ථාවක් ලෙස ආගමික ස්ථාන සඳහා ලබාදුන් වාහන ආනයන බලපත්‍රය මත ආනයනය කරන ලද වාහන 158 කට අධික ප්‍රමාණයක් ලියාපදිංචිය සිදු කිරීමේදී එම බලපත්‍රයට අදාල කොන්දේසි ඉවත් කර ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.

**(ග)** ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයන බලපත්‍ර මත ගෙන්වන ලද වාහන ලියාපදිංචි කිරීමේදී පහත සඳහන් අක්‍රමිකතාවයන් නිරීක්ෂණය විය.

- **(i)** වාහන ආනයන බලපත්‍රවල කොන්දේසි අවිධිමත්ව ඉවත් කර තිබූ අවස්ථා 158 ක් පැවතීම
- **(ii)** වාහනය මුල් ලියාපදිංචිය සිදුකරන ලද අවස්ථාවේදීම ආනයන බලපත්‍රලාභියාගේ නමින් නොව වෙනත් පුද්ගලයින්ගේ නමින් ලියාපදිංචි සිදු කරන ලද අවස්ථා 150 ක් පැවතුණි.

**(iii)** යථෝක්ත යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරන ලද වාහන විකිණීම සහ පැවරීම ලියාපදිංචිය සිදු කළ දිනයේ සිට වසර පහක් යනතුරු සිදු කළ නොහැකි වුවද, එම විධිවිධාන කඩකරමින් එකී කාලසීමාව තුළදීම වෙනත් පාර්ශවයන්ට වාහන පැවරීමේ අවස්ථා 29 ක් නිරීක්ෂණය විය.

**(iv)** යථෝක්ත යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරන ලද වාහනවල නිෂ්පාදන වර්ෂය වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා සාවද්‍ය ලෙස ඉදිරි වර්ෂයන් ඇතුළත් කරමින් ලියාපදිංචි කිරීමේ බරපතල අක්‍රමිකතාවයන් සිදුකළ අවස්ථා 120 ක් පැවතුණි.

**(v)** යථෝක්ත යෝජනා ක්‍රමය යටතේ ආනයනය කර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සිදුකර තිබූ වාහන 03 ක ලිපිගොනු විගණන පරීක්ෂාව සඳහා ලබා දී නොතිබුණි.

**(vi)** ආනයන බලපත්‍රයක් යටතේ ආනයනය කරන ලද වාහනයේ ලිපිගොනුව පරීක්ෂා කිරීමේදී එම වාහනයේ සත්‍ය නිෂ්පාදන වර්ෂය 2005 වුවද, 2008 වශයෙන් සඳහන් කරමින් ලියාපදිංචිය සිදු කර තිබුණි.

**(vii)** එසේම 2013 අප්රේල් 04 දින පරිගණක පද්ධතියේ තොරතුරු අනුව ආනයන බලපත්‍රයක් යටතේ ආනයනය කර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ වාහනයේ නිෂ්පාදන වර්ෂය ලෙස 2004 වර්ෂය සඳහන් කර තිබුණද, නැවත 2013 අප්‍රේල් 18 දින පරිගණක පද්ධතිය පරීක්ෂා කිරීමේදී එකී වාහනයේ නිෂ්පාදන වර්ෂය 2007 වර්ෂය ලෙස වෙනස් කර තිබුණි.

**(ඝ)** මිලටරි මාදිලිය යටතේ ආනයනය කර තිබුණු රෝද හතරේ ට්‍රැක්ටර් 164 ක් එම මාදිලිය යටතේ මැෂී පැරගුෂන් මාදිලිය යටතේ ලියාපදිංචි සිදු කර තිබුණි.

**(ච)** මෝටර් සයිකල් හා වෙනත් භාණ්ඩ වර්ගයන් ආනයනය කරන ලද රේගු ආනයන සටහන්කර අංකයන්ට අදාල ආනයනික සටහන්කර හා වෙනත් ලියකියවිලි කූට ලෙස උපයෝගී කර ගනිමින් බීඑම්ඩබ්ලිව්, ටොයෝටා ප්‍රාඩෝ හා මර්සිඩීස් බෙන්ස් ඇතුළු අධි සුඛෝපභෝගී මෝටර් කාර් රථ 08 ක් ඇතුළු වාහන 26 ක් වංචනික ලෙස ලියාපදිංචි කර තිබුණි.

**(ඡ)** රේගු සංයෝජිත අංක 8705 යටතේ භාණ්ඩ හෝ මගීන් ප්‍රවාහන අරමුණින් බැහැරව විශේෂිත අරමුණු සඳහා ආනයනය කරනු ලබන මෝටර් වාහන 08 ක් ද්විත්ව කාර්යය වාහන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වංචනික ලෙස ලියාපදිංචි කර තිබුණි. මෙකී විශේෂිත කාර්යයන් සඳහා ආනයනය කරනු ලබන වාහන සඳහා රේගු සංයෝජිත අංක 8705 යටතේ සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 01 – 02 ත් අතර, රේගු බද්දක් අයකරනු ලබන අතර, ද්විත්ව කාර්යය වාහනයක් ලෙස රේගු සංයෝජිත අංක 8702 හෝ 8704 යටතේ ආනයනය කරනු ලබන වාහන සඳහා රේගු බදු ලෙස රුපියල් ලක්ෂ 15 – 50 ත් අතර, බදු මුදලක් අයකළ යුතුවේ. ඒ අනුව විශාල බදු මුදලක් මෙමගින් රජයට වංචාකර ඇති බව නිරීක්ෂණය විය.

**(ජ)** CBMVI – 5636 හා 2009 දෙසැම්බර් 29 දිනැති රේගු සටහන්කර අංකය මඟින් රේගු සංයෝජිත අංක 8706.00.03 මඟින් වාහනවල චෙසි හා එන්ජින් ඇතුළත් වාහන අමතර කොටස් ආනයනය කර තිබුණද, එකී අමතර කොටස් යොදවා ගෙන නීති විරෝධී ලෙස සකසන ලදැයි පෙනී යන වාහන 23 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ද්විත්ව කාර්යය වාහන ලෙස ලියාපදිංචි කර තිබුණි.

**(ට)** CBMVI - 570 2009 පෙබරවාරි 03 සහ CBMVI – 207 හා 2009 ජනවාරි 12 දිනැති ආනයන රේගු සටහන් කර මඟින් ලැන්ඩ් රෝවර්, ට්‍රක්, කැබ් රථ 08 ක් ඇතුළු වාහන අමතර කොටස් ආනයනය කර තිබුණි.එකී වාහන 08 න් වාහන දෙකක් මෝටර් රථ කාර් යටතේ සුඛෝපභෝගී ජීප් රථ දෙකක් ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වංචනික ලෙස ලියාපදිංචි කර තිබුණි.

**(ඨ)** 2011 නොවැම්බර් 22 දින සිට 2012 අප්‍රේල් 25 දින දක්වා වූ කාලය තුළ පමණක් ලියාපදිංචිය සිදු කරන ලද මෝටර් වාහන සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ විගණන නියැදි පරීක්ෂාවේදී සුඛෝපභෝගී බදු අයකළ යුතු වාහන 03 කින් සහ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය බදු අය කළ යුතු වාහන 22 කින්ද බදු අයකර ගැනීම සම්පූර්ණයෙන් අත්හැර තිබුණි. මෙම අත්හැරීම මත රජයට අය නොවූ බදු මුදලේ වටිනාකම රු.940,000 ක් වූ අතර, ඒ අනුව ඉදිරි වසර 06 තුළද රජයට අහිමි වන බදු ආදායමේ වටිනාකම රු.1,962,000 ක් වී තිබුණි.

(ද) වාහන පවරන්නා විසින් දෙපාර්තමේන්තුවට එවන ලද (MTA 6) වාහන පැවරුම් ආකෘති පත්‍රයේ වාහනය පැවරුම් කරන ලද දිනය රහිතව ඉදිරිපත් කර තිබූ අවස්ථා 03 ක් පැවතුණි.

(ධ) වෙසි අංක KDH 200 – 004118 දරන වාහනය විකිණීම, පැවරීම හා අන්සතු කිරීම, ලියාපදිංචිය සිදු කළ දිනයේ සිට වසර පහක් යනතුරු සිදු කළ නොහැකි බවට පැවති කොන්දේසිය ආනයන හා ආපනයන පාලක විසින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණු ලිපියක් මගින් ඉවත් කර තිබුණි.කෙසේ වුවද, ආනයන අපනයන පාලකවරයා විසින් එවැනි ලිපියක් නිකුත් කර නොමැති බව විගණනය වෙත සනාථ කර තිබුණි. ඒ අනුව ව්‍යාජ ලියවිල්ලක් මත මෙම වාහනයේ කොන්දේසි ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

(න) වාහනයේ ලියාපදිංචි අයිතිකරුවන් විසින් මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයා වෙත එවා තිබුණු අයදුම්පත් (MTA 6) සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී වාහනවල සන්තකය වෙනස් වී දින දාහතරකට වැඩි කාලයක් ගත වී තිබුණද, නව අයිතිකරුවන් යටතේ එම වාහන ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර නොතිබුණු අවස්ථා 33 ක් පැවතුණි.

(ප) වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණ (MTA 6) අයදුම්පතට අනුව වාහනයේ පැවරුම් දිනයත්, වාහනයේ ලියාපදිංචි සහතිකයේ සඳහන් පැවරුම් දිනයත් අතර, වෙනස්කම් පැවතුණු අවස්ථා දාහතරක් පැවතුණි.ඒ අනුව නව වාහන අයිතිකරුවන් විසින් වාහනයේ සන්තකය වෙනස් කර ගැනීම සඳහා මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන (MTA 6) අයදුම්පත ප්‍රමාද දඩ මුදල් අය නොවන ලෙස හෝ අඩුවෙන් අයවන ලෙස හෝ සත්‍ය පැවරුම් දිනය ව්‍යාජ ලෙස වෙනස් කර ඉදිරිපත් කර තිබුණි.

(ද) වාහන අයිතිය වෙනස්වීම දෙවරක් සිදු වී තිබුණද, පළමුවර සිදු වූ වාහනයේ සන්තකය වෙනස්වීම වසන් කර දෙවන වර වාහනයේ සන්තකය වෙනස්වීම පමණක් සිදු කිරීම තුළින් අක්‍රමිකතාවයක් සිදුකර තිබූ අවස්ථා තුනක් නිරීක්ෂණය විය.මෙම තත්ත්වය සමස්ථයක් ලෙස සැලකිල්ලට ගැනීමේදී බොහෝ වාහනවල සන්තකය වෙනස්වීම නිත්‍යානුකූලව සිදු නොවන අතර, විවෘත පැවරුම් මගින් සිදුවන බව නිරීක්ෂණය විය.

**(ධ)** සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය බදු ගෙවීම සඳහා යොදා ගනු ලබන පාවිච්චි නොකළ කුවිතාන්සි පොත් විශාල ප්‍රමාණයක් අස්ථානගත වී තිබුණු අතර, එකී අස්ථානගත වී තිබුණු බදු කුවිතාන්සි වංචනික ලෙස බදු මුදල් ගෙවීම සඳහා යොදවා ගෙන තිබූ අවස්ථා දෙකක් දෙපාර්තමේන්තුව විසින් අනාවරණය කරගෙන තිබුණි.එසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් බදු කුවිතාන්සි පොත් කොපමණ ප්‍රමාණයක් අස්ථානගත වී තිබුණද, යන්න සොයා බලා එම අස්ථානගත වී ඇති කුවිතාන්සි සහ එයට වගකිව යුතු නිලධාරීන් පිළිබඳව හා කුවිතාන්සි පොත් පිළිබඳව සහ එයට වගකිව යුතු නිලධාරීන් පිළිබඳව පරීක්ෂණයක් කර මුදල් රෙගුලාසි 343 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(න)** අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය බදුවලට යටත් ඩබල් කැබ් රථයක් මෝටර් වාහන පනතට අනුව ද්විත්ව කාර්යය වාහනයක් ලෙස ලියාපදිංචි කළයුතු වුවද, මෝටර් ලොරියක් ලෙස ලියාපදිංචි කර තිබුණි.ඉහත පරිදි මෝටර් ලොරි ලෙස දැක්වීම මත වාර්ෂිකව අයකරගත යුතු අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය බදු අයකර ගෙන නොතිබුණි.එම තත්ත්වය මත වර්ෂ තුනකට අදාල රු.27,000 ක අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය බදු අයකර ගෙන නොතිබුණි.

**(ණ)** SU 14 – 108288 දරන චෙසි අංකය භාවිතා කරමින් වාහන දෙකක් ලියාපදිංචි කර තිබුණි.

**3.12 අනාර්ථික ගනුදෙනු**

------------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ)** දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා 2012 ජනවාරි 28 දින සිට පෙබරවාරි 13 දින දක්වා දෙපාර්තමේන්තු නිලධාරීන් 19 දෙනෙකු සහභාගීවීම වෙනුවෙන් එක් අයෙකුට දිනකට රු.1,670 බැගින් රු.698,863 ක් ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවීම් කර තිබුණි.එම කාල පරිච්ඡේදය තුළ නිලධාරීන් සහභාගී නොවූ මිනිස් දින 172 ක් සඳහා ද ආහාර හා නවාතැන් පහසුකම් වෙනුවෙන් රු.287,240 ක නිෂ්කාර්ය වියදමක් කර තිබුණි.

**(ආ)** 2012 දැයට කිරුළ හා අනෙකුත් ජංගම සේවාවන් සඳහා රු.698,863 ක අත්පත්‍රිකා මුද්‍රණය කර තිබුණද, 2013 වර්ෂයේදී භෞතික විගණන පරීක්ෂාවේදී රු.270,000 ආසන්න වටිනාකම ඇති අත්පත්‍රිකා 40,000 අධික ප්‍රමාණයක් බෙදා නොහැර ලේඛණාගාර ගබඩාවේ ගොඩ ගසා තිබුණි.

**(ඇ)** දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය සැකසීම සඳහා 2011 වර්ෂයේ රු.2,348,700 ක්ද (ප්‍රධාන කුටියේ වියදම හැර) 2010 වර්ෂයේ රු.2,707,985 ක්ද, 2009 වර්ෂයේ රු.2,227,479 ක්ද වශයෙන් අසාමාන්‍ය වියදමක් දරා තිබුණද, 2012 වර්ෂයේ ප්‍රවාහන අමාත්‍යාංශය මැදිහත්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම තුළින්, මෙම ප්‍රධාන කුටියේ දෙපාර්තමේන්තු කොටසද ඇතුළුව ප්‍රදර්ශන කුටිය සැකසීම සඳහා වැය කරන ලද මුළු මුදල රු.1,377,000 ක් වී තිබුණි.ඒ අනුව 2012 වර්ෂයේදී ඊට පෙර වර්ෂවලට වඩා රුපියල් ලක්ෂ 10 කටත් වඩා අඩු මුදලකට මෙම කටයුත්ත ඉටුකර ගැනීම තුළින් ඉකුත් වර්ෂ තුන සඳහා රුපියල් ලක්ෂ 30 කට අධික අනාර්ථික වියදමක් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 21 | 05 |
| **(ii)** | තෘතියික මට්ටම | 23 | 07 | 16 |
| **(iii)** | ද්විතියික මට්ටම | 788 | 766 | 22 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 127 | 114 | 13 |
| | **එකතුව** | **964** | **908** | **56** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 56 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** සේවක කාණ්ඩ පහක් සඳහා අනුමත සේවක සංඛ්‍යාව නිලධාරීන් හයදෙනෙකුගෙන් යුක්ත වුවද, එම අනුමත සම්පූර්ණ සේවක සංඛ්‍යාවම පුරප්පාඩුව පැවතුණි.

**(ඇ)** ජ්‍යෙෂ්ඨ මෝටර් ප්‍රවාහන පරීක්ෂක තනතුරේ අනුමත සේවක සංඛ්‍යාව 16 වුවද, එයින් සංඛ්‍යාව සියයට 75 ක් හෙවත් තනතුරු 12 ක් පුරප්පාඩුව පැවතුණි.